*සැ. යු.* - (i) 2019.01.11 දින පළ වූ අංක 2,106 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2019 වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කළාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,107 - 2019 ජනවාරි මස 18 වැනි සිකුරාදා - 2019.01.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 74 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 102 |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 110 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 පෙබරවාරි මස 08 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජනවාරි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


73 - B 81487— 5,403 (2019/01)

## තනතුරු - ඇබෑර්තු

### මැදදුම්බර ප්‍රාදේශීය සභාව

### රියදුරු තනතුරේ III ශ්‍රේණියට විවෘත හා සීමිත පදනම යටතේ බඳවා ගැනීම

මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ රියදුරු තනතුරේ පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පහත සුදුසුකම් සපුරා ඇති මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *පුරප්පාඩු තනතුර* : රියදුරු

පුරප්පාඩු සංඛ්‍යාව : 02

සේවා ගණය : ප්‍රාථමික (ශිල්පීය)

බඳවා ගන්නා ශ්‍රේණිය : III

*තනතුරේ ස්වභාවය* : මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් පිළිබඳව රජය විසින් කලින් කලට පනවනු ලබන නියමයන්ට යටත් වේ.

*වැටුප් ක්‍රමය* :- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි PL03-2016 අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ රියැදුරු තනතුරට හිමි වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු. 25,790- 10 x 270- 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990
(ඉහත චක්‍රලේඛයෙහි උපලේඛන II අනුව 2019.01.01 දිනට වැටුප රු. 23,126 කි. මෙම චක්‍රලේඛයෙහි විධිවිධාන පරිදි ඉදිරි වැටුප් ගෙවීම් සිදු කරනු ලබයි.)

02. විවෘත හා සීමිත බඳවා ගැනීම සඳහා සුදුසුකම් :

*අධ්‍යාපන සුදුසුකම්* :- අ.පො.ස. (සා/පෙ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබිය යුතු අතර, මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි.

*වෘත්තීය සුදුසුකම්* :- තාර බර හොන්ඩර් 34 ට වැඩි මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය. එම බලපත්‍රය බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද A පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව D පන්තියේ බලපත්‍රයක් විය යුතුය.

*පළපුරුද්ද* : මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලැබීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.

*කායික සුදුසුකම්* :- සෑම අයදුම්කරුවෙකුම මනා ඇස් පෙනීමක් ලබා තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

අවම උස අඩි 5 අඟල් 2 1/2 ක් විය යුතුය.

*වෙනත් සුදුසුකම්* :-

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචියක් තිබිය යුතුය. සම්මුඛ පරීක්ෂණයට කැඳවුවහොත් ඡන්දහිමි නාම ලේඛණය මගින් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය මගින් පදිංචිය සනාථ කළ යුතුය.
(iii) මහා මාර්ග නීති සංග්‍රහය හා මාර්ග සංඥා පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.
(iv) බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *වයස් සීමාව* :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුය. මෙම සභාවේ සේවයේ යෙදී සිටින ස්ථිර තනතුරු දරන අය සම්බන්ධව උපරිම වයස් සීමා බලපානු නොලැබේ.

04. *බඳවා ගැනීමේ ක්‍රමය* :-

විවෘත බඳවා ගැනීම - විවෘත ධාරාව යටතේ ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයින්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලු ම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

*සීමිත බඳවා ගැනීම* - දැනටමත් මෙම සභාවේ තනතුරක ස්ථිර කර ඇති මූලික සුදුසුකම් සපුරා ඇති සේවකයින් සඳහා අදාළ වේ.

කායික මානසික යෝග්‍යතාවය හා අධ්‍යාපන වෘත්තීය හා පොදු සුදුසකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයකදී සුදුසුකම් ලබා ගත යුතුය.

05. *බඳවා ගැනීමේ පිළිවෙල* :-

(i) ලිඛිත විභාගය පහත සඳහන් විෂය නිර්දේශය යටතේ පවත්වනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *විෂයෙන් සමත් වීමට ගත යුතු අවම ලකුණු* |
|---|---|---|---|
| මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% |
| මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% |

(ii) අයදුම්පත් අනුව බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති සියළු අයදුම්කරුවන් ඉහත සඳහන් විෂයන් යටතේ, ලිඛිත පරීක්ෂණයකට යොමු කර, ඉන් 40% ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. (ඒ සඳහා ලබා දෙන උපරිම ලකුණු ප්‍රමාණය 100 කි).

(iii) අවශ්‍ය සියළු සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

03. *සේවා කොන්දේසි* :-

(i) වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වන අතර එම කාලය තුළ සතුටුදායක ලෙස සේවය නොකළහොත් පත්වීම ස්ථිර නොකර සේවය අවසන් කරනු ඇත.

(iii) අදාළ පත්වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල සඳහන් විධිවිධානයන්ට යටත් වේ.

(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය මුදල් රෙගුලාසි දෙපාර්තමේන්තු නියෝග මධ්‍යම පළාත් සභාව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා මැදදුම්බර ප්‍රාදේශීය සභාව වරින් වර නිකුත් කරන නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

(v) පත්වීම ලබා මාසයක් ඇතුලත නියමිත සුදුසුකම් ඇති වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

04. *අයදුම් කිරීමේ අනුපිළිවෙල :*

i. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආකෘතිය අනුව පමණක් සකස් කළ අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කොට 2019.02.15 දිනට පෙර ලැබෙන සේ ''ලේකම්, මැදදුම්බර ප්‍රාදේශීය සභාව, තෙල්දෙණිය'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ.

ii. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

iii. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හෝ අසම්පූර්ණ හෝ මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් පිළිබඳව මෙම ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.

iv. අයදුම්පතේ සඳහන් කරනු ලබන සුදුසුකම් සනාථ කිරීමට අදාළ ලියවිලිවල ඡායා පිටපත් අයදුම් පත සමග අමුණා එවිය යුතුය. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබුවහොත් එම අවස්ථාවේ මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

06. *අයදුම්පත් පිරවීම සඳහා උපදෙස් :-*

i. ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-9 දක්වා කරුණුද දෙවන පිටෙහි 10-14 දක්වා කරුණුද තුන්වන පිටෙහි ඉතිරි ඡේදද ඇතුළත් වන සේ සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කර ගත යුතුය.

ii. අයදුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු සමාදාන විනිශ්චයකාරවරයෙකු දිවුරුම් නොතාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රු. 240,360 කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

iii. යම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලිපිය ලැබීමට පෙර හෝ පත්වීම් ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක දී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

iv. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

07. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුරදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනසක් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

08. 2017.09.08 දින අංක 2036 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (IVආ) වැනි කොටසේ මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ තනතුරු පුරප්පාඩු වෙනුවෙන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම පිළිබඳ පළ කරන ලද *ගැසට් නිවේදනය* මෙයින් අවලංගු කරනු ලැබේ.

සුමනා විජේරත්න,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 31 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව,
තෙල්දෙණිය.

ආදර්ශ අයදුම්පත්‍රය

*මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ ......................................... III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ අයදුම් පත්‍රය*

අදාළ කොටුව තුළ“✓ ” ලකුණ යොදන්න.

01. (1) මුලකුරු සමග නම :_______________________________.

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :_______________________________.

02. පෞද්ගලික ලිපිනය :_______________________________.

03. දුරකථන අංකය :_______________________________.

04. උපන් දිනය : අවුරුද්ද: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

05. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස : අවු.: ☐☐ මාස: ☐☐ දින: ☐☐

06. ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐

07. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? ඔව් ☐ නැත ☐

එසේ නම් පරම්පරාවෙන් ද? ☐

ලියාපදිංචි වීමෙන් ද? ☐

08. ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී ☐ පුරුෂ ☐

09. විවාහක/අවිවාහක බව විවාහක ☐ අවිවාහක ☐

10. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය :_______________________________

11. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා පෙළ) විභාගය පිළිබඳ විස්තර (ලබා ඇති විශිෂ්ට හෝ සම්මාන සාමාර්ථ අනුව විෂයන් පිළිවෙළින් සඳහන් කරන්න.)

පෙනී සිටි වාරය 1
විභාග අංකය :________________
වර්ෂය :________________

පෙනී සිටි වාරය - 11
විභාග අංකය :________________
වර්ෂය :________________

| අනු. අංකය | විෂයයන් | සාමාර්ථය | අනු. අංකය | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1 | | | 1 | | |
| 2 | | | 2 | | |
| 3 | | | 3 | | |
| 4 | | | 4 | | |
| 5 | | | 5 | | |
| 6 | | | 6 | | |
| 7 | | | 7 | | |
| 8 | | | 8 | | |
| 9 | | | 9 | | |
| 10 | | | 10 | | |

12. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :-..........................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................

13. වෙනත් සුදුසුකම් :..........................................................................................
.............................................................................................................................
.............................................................................................................................

14. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :..............................................
i. සේවයේ යෙදී සිටින තනතුර :..............................................
ii. කවද සිටද යන වග :..............................................

15. මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත් තෝරා ගැනීමෙන් පසු හෝ පත්වීමක් ලද පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දනිමි.

...........................
අයදුම්කරුගේ අත්සන.

දිනය ::..............................................

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරන................................ මයා/මිය/මෙය මම පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

.......................................
සහතික කරන්නාගේ අත්සන

දිනය : .......................................

සහතික කරන්නාගේ සම්පූර්ණ නම : .......................................
තනතුර : .......................................
ලිපිනය : .......................................

17. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන .......................... මයා/මිය/මෙය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ/(ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්) පදනම මත ..........................කු වශයෙන් සේවය කරයි. ඔහු/ඇය අයදුම්කරන තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම් පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

.......................................
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය : .......................................
සම්පූර්ණ නම : .......................................
තනතුර : .......................................
නිල මුද්‍රාව : .......................................

01-305/1

## මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය නොවන) තනතුරුවල පවතින පුරප්පාඩු වෙනුවෙන් III ශ්‍රේණිය සඳහා විවෘත බඳවා ගැනීම

මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරු වල පවත්නා පුරප්පාඩු සඳහා විවෘත බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පුරප්පාඩු තනතුරු :

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| කාර්යාල කාර්ය සහායක | 01 |
| මුරකරු | 01 |
| ජල කම්කරු | 01 |
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 04 |
| සෞඛ්‍ය කම්කරු | 05 |

සේවා ගණය : ප්‍රාථමික (ශිල්පීය නොවන)

බඳවා ගන්නා ශ්‍රේණිය : III

තනතුරේ ස්වභාවය : මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් පිළිබඳව රජය විසින් කලින් කලට පනවනු ලබන නියමයන්ට යටත් වේ.

වැටුප් ක්‍රමය : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි PL01-2016 අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෙම තනතුරු සඳහා හිමි වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු. 24,250- 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (ඉහත චක්‍රලේඛයෙහි උපලේඛන II අනුව 2019.01.01 දිනට වැටුප රු. 21,746 කි. මෙම චක්‍රලේඛයෙහි විධිවිධාන පරිදි ඉදිරි වැටුප් ගෙවීම් සිදුකරනු ලබයි.)

අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබිය යුතු අතර, මින් විෂයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි.

සැ. යු.- සෞඛ්‍ය කම්කරු හා වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුරු සඳහා බඳවා ගැනීමේ දී ඉහත සඳහන් පරිදි අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති වුවහොත්, අධ්‍යාපන සුදුසුකම් 5 ශ්‍රේණිය සමත්වීම දක්වා අඩුකර බඳවා ගැනීමට සලකා බලනු ලැබේ.

කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමකින් හා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

02. වෙනත් සුදුසුකම් :

i. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචියක් තිබිය යුතුය. අයදුම්පත් අනුව බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා තිබීම මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් එහිදී ඡන්දහිමි නාම ලේඛනය මගින් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය මගින් පදිංචිය සනාථ කළ යුතුය.

ii. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

v. රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතුය.

03. *වයස් සීමාව :-*

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු 18 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුය. මෙම සභාවේ සේවයේ යෙදී සිටින ස්ථිර තනතුරු දරන අය සම්බන්ධව උපරිම වයස් සීමා බලපානු නොලැබේ.

04. *බඳවා ගැනීමේ පිළිවෙල :-*

i. බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති සියළු අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කර අවශ්‍ය සියළු සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

ii. පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ දී සභාවේ දැනටමත් සේවයේ නියුතු සේවකයින් සඳහා බඳවා ගැනීමේදී ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

05. *සේවා කොන්දේසි :-*

i. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දාය ක මුදල් ගෙවිය යුතුය.

ii. පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වන අතර එම කාලය තුළ සතුටුදායක ලෙස සේවය නොකළ හොත් පත්වීම් ස්ථිර නොකර සේවය අවසන් කරනු ඇත.

iii. අදාළ පත්වීම් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වල සඳහන් විධිවිධානයන්ට යටත් වේ.

iv. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි දෙපාර්තමේන්තු නියෝග මධ්‍යම පළාත් සභාව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා මැදදුම්බර ප්‍රාදේශීය සභාව, වරින් වර නිකුත් කරන නියෝගවලටද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

v. පත්වීම ලබා මාසයක් ඇතුලත නියමිත සුදුසුකම් ඇති වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

06. *අයදුම් කිරීමේ අනුපිළිවෙල :*

i. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආකෘතිය අනුව පමණක් සකස් කළ අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කොට 2019.02.15 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, මැදදුම්බර ප්‍රාදේශීය සභාව, තෙල්දෙණිය'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ.

ii. අයදුම්පතේ සඳහන් කරනු ලබන සුදුසුකම් සනාථ කිරීමට අදාළ ලියවිලි වල ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුය. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබුවහොත් එම අවස්ථාවේ මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

iii. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හෝ අසම්පූර්ණ හෝ මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් පිළිබඳව මෙම ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.

iv. තනතුරු කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම අයදුම්පත් සකස් කර ගත යුතු අතර, එකම කවරයක බහා එවීම ප්‍රමාණවත් වේ. එහිදී අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුරු සියල්ලම සඳහන් කළ යුතුය.

07. *අයදුම්පත් පිරවීම සඳහා උපදෙස් :-*

i. ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-9 දක්වා කරුණුද දෙවන පිටුවෙහි 10-14 දක්වා කරුණුද තුන්වන පිටෙහි ඉතිරි ඡේදද ඇතුළත් වන සේ සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කර ගත යුතුය.

ii. අයදුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චකාරවරයෙකු, දිවුරුම් නොතාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රු. 240,360 කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

iii. යම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලිපිය ලැබීමට පෙර හෝ පත්වීම ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක දී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

iv. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

08. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුරදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනසක් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

09. 2017.09.08 දින අංක 2036 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ තනතුරු පුරප්පාඩු වෙනුවෙන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම පිළිබඳ පළ කරන ලද *ගැසට්* නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

සුමනා විජේරත්න,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 31 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව, තෙල්දෙණිය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ* .......................... III *ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ අයදුම් පත්‍රය*

අදාළ කොටුව තුළ " ✓ " ලකුණ යොදන්න.

01. (1) මුලකුරු සමග නම :——————————.

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.

02. පෞද්ගලික ලිපිනය :——————————.

03. දුරකථන අංකය :——————————.

03. උපන් දිනය : අවුරුද්ද: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

04. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස : අවු.: ☐☐ මාස: ☐☐ දින: ☐☐

05. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

06. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? ඔව් ☐ නැත ☐

එසේ නම් පරම්පරාවෙන් ද?: ☐

ලියාපදිංචි වීමෙන් ද? ☐

07. ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී ☐ පුරුෂ ☐

08. විවාහක/අවිවාහක බව විවාහක ☐ අවිවාහක ☐

09. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය :———————————

10. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා පෙළ) විභාගය පිළිබඳ විස්තර (ලබා ඇති විශිෂ්ට හෝ සම්මාන සාමාර්ථ අනුව විෂයන් පිළිවෙළින් සඳහන් කරන්න.)

පෙනී සිටි වාරය 1
විභාග අංකය :——————
වර්ෂය :——————

පෙනී සිටි වාරය - 11
විභාග අංකය :——————
වර්ෂය :——————

| අනු. අංකය | විෂයන් | සාමාර්ථය | අනු. අංකය | විෂයන් | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1 | | | 1 | | |
| 2 | | | 2 | | |
| 3 | | | 3 | | |
| 4 | | | 4 | | |
| 5 | | | 5 | | |
| 6 | | | 6 | | |
| 7 | | | 7 | | |
| 8 | | | 8 | | |
| 9 | | | 9 | | |
| 10 | | | 10 | | |

11. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :.................................................................................
.....................................................................................................................
.....................................................................................................................
.....................................................................................................................

12. වෙනත් සුදුසුකම් :...........................................................................................
.....................................................................................................................
.....................................................................................................................

13. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :----------------------

i. සේවයේ යෙදී සිටින තනතුර :----------------------
ii. කවදා සිටද යන වග :----------------------

14. මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු හෝ පත්වීමක් ලද පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දනිමි.

-----------------------
අයදුම්කරුගේ අත්සන.

දිනය :----------------------

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරන.......................................................................... මයා/මිය/මෙය මම පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

----------------------
සහතික කරන්නාගේ අත්සන

දිනය :----------------------

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :----------------------
තනතුර :----------------------
ලිපිනය :----------------------

16. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන ........................................................... මයා/මිය/මෙය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ/(ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්) පදනම මත................................................................ කු වශයෙන් සේවය කරයි. ඔහු/ඇය අයදුම්කරන තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම් පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

----------------------
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :----------------------
සම්පූර්ණ නම :----------------------
තනතුර :----------------------
නිල මුද්‍රාව :----------------------

01-305/2

---

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෙනත්/වෘත්තීය සුදුසුකම්* | *බඳවා ගැනීමේ/පළපුරුද්ද* | *මාසික වැටුප් පරිමාණය* |
|---|---|---|---|---|---|---|
| 01 | රියදුරු III ශ්‍රේණිය | 01 | අ.පො. ස (සා. පෙළ.) දෙවරකට නොවැඩි වාර ගණනකදී ඕනෑම විෂයයන් 06 ක් සමත්වීම. | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද වලංගු බර වාහන බලපත්‍රය ලබා තිබීම. | බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. | රා. ප. ච. 3/2016 PL3/2016) අනුව රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - 38,990- 2020.01.01 සිට ක්‍රියාත්මක වන අතර ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව වැටුප හිමිවේ. |

02. *වයස් සීමාව* :

i. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.
ii. දැනට රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

03. *පොදු සුදුසුකම්* :-

i. අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතු අතර අයදුම්පත් කැඳවන අවසාන දිනට දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ පූර්වාසන්න වසර 5 ක අනුගාමී වසර 03 තුළ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය. කරන්දෙණිය බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර තත්ත්වයෙන් යුක්ත විය යුතුය.

iii. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු හෝ රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.

iv. අයදුම්කරුවන් අදාළ තනතුර සඳහා සඳහන් වී ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

04. *පොදු කොන්දේසි* :-

i. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

ii. තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂාවේ දී ශාරීරික වශයෙන් නුසුදුස්සෙක් බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :-

i. මෙම තනතුර ස්ථිරය.

ii. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත්විය යුතුය.

iii. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුලදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරේ ස්ථිර කර ඇති තැනැත්තන් එක් වසරක වැඩ බැලීමේ කාලයකට යටත් කර බඳවා ගනු ලැබේ.

06. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි වලට ද, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලට ද, දකුණු පළාත් සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලටද අනුකුලව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

07. *බඳවා ගැනීමේ ක්‍රමය* :-

i. සුදුසුකම් සපුරන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය හා වෘත්තීය ප්‍රවීනතා තහවුරු කර ගැනීමේ ප්‍රතිඵල මත බඳවා ගැනේ.

ii. තනතුරට බඳවා ගැනීම සඳහා වූ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය

| | | | |
|---|---|---|---|
| 1.1 | අ.පො.ස. සා/පෙළ සාමාර්ථ සඳහා | (8 x 1) = 8 | |
| 1.2 | අ.පො.ස. සා/පෙළ සම්මාන සාමාර්ථ සඳහා | (8 x 2) = 16 | (උපරිම) |
| | අ.පො.ස. උ/පෙළ සමත් වීම | = 04 | |
| 2. | වෘත්තියට අදාළ දැනුම | = 10 | |
| 3. | පෞරුෂත්වය | = 05 | |
| 4. | වෘත්තියට අදාලව පුහුණුවක් හෝ සේවා පළපුරුද්දක් ලබා තිබීම | = 15 | |
| | (වසරකට ලකුණු 2 බැගින්) මුලු එකතුව | = 50 | |

සමත්වීම සඳහා 40% (ලකුණු 20) ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගත යුතුය.

iii. වෘත්තීය ප්‍රවීණතා පරීක්ෂණය

මෙහි දී වෘත්තියට අදාළ දැනුම පරීක්ෂා කරනු ලැබේ.
මුළු ලකුණු 50, සමත්වීම සඳහා 40% (ලකුණු 20) ලබාගත යුතුය.

08. අයදුම්පත් එවිය යුතු ආකාරය :

අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපත් ද අමුණා එවිය යුතුය.

i. හැඳුනුම්පත් පිටපත
ii. උප්පැන්න සහතිකය
iii. අධ්‍යාපන සහතික හා පාසල් හැරයාමේ සහතිකය
iv. පදිංචිය සනාථ කිරීමේ සහතිකය (පදිංචි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් මාස 06 ක් තුළ දී නිකුත්කරන ලදුව අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව තිබිය යුතුය.)
v. මෑතක දී ලබා ගත් චරිත සහතික 2 ක්
vi. වෘත්තීය හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික (තිබේ නම්)

මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් 2019.01.31 දිනට පෙර ''සභාපති'' කරන්දෙණිය ප්‍රාදේශීය සභාව, කරන්දෙණිය'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. (අයදුම්පත A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතුය.) අසම්පූර්ණ, අපැහැදිලි මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ගාමිණී අමරවංශ මුණුගොඩ,
සභාපති,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2019 ජනවාරි මස 04 වැනි දින,
කරන්දෙණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

රියදුරු තනතුර සඳහා අයදුම්පත්‍රය

1. නම :—————————————
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————————————
2. ස්ථිර පදිංචි ලිපිනය :—————————————
3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————————————
4. උපන් දිනය :—————————————
   අවුරුද්ද:———— මාසය:———— දිනය:————
5. ජාතික හැඳුනුම්පත් අංකය :—————————————
6. ස්ත්‍රී/පුරුෂ භාවය :—————————————
7. අයදුම්පත් භාර ගන්නා 2019.01.31 දිනට වයස :—————————————
   අවුරුද්ද:———— මාසය:———— දිනය:————
8. විවාහක/අවිවාහක බව :—————————————
9. ජාතිය :—————————————
10. ඔබ ශ්‍රී ලාංකිකයෙක් ද? ලියාපදිංචියෙන් ද යන වග :—————————————

11. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර)

i. සමත් වූ වසර/ශ්‍රේණිය :————————
ii. අ.පො.ස.(සා/පෙළ) විභාගය :————————

විභාග අංකය:————————
විභාග වර්ෂය හා මාසය:————————
සමත් වූ විෂයයන්:————————

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

12. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුයි) ඃ ..................................
13. සේවා පළපුරුද්ද ඃ ..................................
14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? ඃ ..................................
එසේ නම් තොරතුරු ඃ ..................................

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට සනාථ වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————

**දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන ......................... මහතා/මහත්මිය/මෙනෙවිය, දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ...................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :————————
පදවි නාමය:————————
දෙපාර්තමේන්තුව/ආයතනය:————————
(නිල මුද්‍රාව යොදන්න.)
දිනය :————————

01-532

## නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව

ප්‍රාථමික ශ්‍රේණියේ, ශිල්පීය, අර්ධ ශිල්පීය, ශිල්පීය නොවන තනතුරු සඳහා බඳවා ගැනීම.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති සහා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් 2019 පෙබරවාරි 01 දිනට පෙර "ලේකම්, නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ විසින් ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතුය. තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේ නම් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමු කළ යුතුය.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01. | රියදුරු III වන ශ්‍රේණිය | 04 | නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව<br><br>මූලික අවශ්‍යතාවයක් වන ප්‍රවාහනය සම්බන්ධ කාර්යයන්ගෙන් සමන්විත වූ කාර්ය භාරයක් සහ ආයතන ප්‍රධානියා විසින් සේවයේ අවශ්‍යතාවය මත පවරනු ලබන රාජකාරී කටයුතු ද මෙම තනතුරු දරන්නන්ට පැවරේ. | PL - 03 2016 රු. 25790 - 10x270 - 10 x 300 - 10 x 330 -12 x 350 - රු. 38,990/- | අධ්‍යාපන සුදුසුකම් :<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි.<br><br>වෘත්තීය සුදුසුකම් :<br><br>තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ඒ1/ ඒ/බී 1/බී/සී1/ සී/ සීඉ ඩී1/ ඩී/ ජී1/ ජී/ ජේ පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.<br><br>පළපුරුද්ද:<br><br>මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුයි.)<br><br>කායික සුදුසුකම් :<br><br>අවම උස අඩි 05 අඟල් 02 1/2ක් විය යුතුයි.<br><br>මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.<br>ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළ ලකුණු ලැබූ අපේක්ෂකයින්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.<br><br>*බඳවා ගැනීමේ ක්‍රමය :*<br><br>*ධාරාව* *ප්‍රතිශතය*<br>විවෘත 70%<br>සීමිත 30% |
| 02. | ආයුර්වේද ඖෂධ සංයෝජක III වන ශ්‍රේණිය | 01 | නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව<br><br>තනතුරට අදාළව හා අවශ්‍යතාවය මත ආයතන ප්‍රධානියා විසින් තීරණය කර පවරන්නා වූ රාජකාරි | PL 2 - 2016 රු. 25,250 - 10x270 - 10 x 300 - 10 x 330 -12 x 350 - රු. 38,450/- | අධ්‍යාපන සුදුසුකම් :<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම.<br><br>ශිල්පීය නිපුනතා / ප්‍රවීණතා<br>වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 02 වන මට්ටමේ (NVQ 2) හෝ 3 වන මට්ටමේ (NVQ 3) සහතිකය ලබා තිබීම.<br>හෝ<br>කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලා-වක් හදාරා සහතික ලබා තිබීම.<br>හෝ<br>ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br>හෝ<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br><br>හෝ |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAI-TA) වෘත්තියට අදාලව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.<br>හෝ<br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තීයට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br>පළපුරුද්ද :<br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම, (පුහුණු කාල සීමාව යටත් පිරිසෙයින් අවුරුදු 2 ක් වත් විය යුතුය.) |
| 03. | මාර්ග කම්කරු III වන ශ්‍රේණිය | 12 | නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව<br>මාර්ග දෙපස කාණු පවිත්‍ර කිරීම, තණකොළ කැපීම, කහ ඉරි ඇඳීමට සහාය වීම, තාර දැමීම, ප්‍රිමික්ස් සැක-සීමට අත් උදව් දීම, මාර්ග අතු ගෑම, පිරිසිදු කිරීම, ගලි යන්ත්‍රයේ කාර්යයන්, කසල එකතු කරන ට්‍රැක්ටර්වලට දැමීම. | PL 1 - 2016 රු. 24,250 - 10x250 - 10 x 270 - 10 x 300 -12 x 330 - රු. 36,410/- | අධ්‍යාපන සුදුසුකම් :<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථා වලදී 5 ශ්‍රේණිය සමත් අයවළුන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 04. | සෞඛ්‍ය කම්කරු III වන ශ්‍රේණිය | 24 | නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව<br>මාර්ග දෙපස කාණු පවිත්‍ර කිරීම, තණකොළ කැපීම, මාර්ග අතුගෑම, පිරිසිදු කිරීම, ගලි යන්ත්‍රයේ කාර්යයන්, සභාවේ භාවිතා වන ක්‍රමවේදයන් අනුව කසල වෙන්කර එකතු කර ට්‍රැක්ටර් වලට භාර දීම, පොදු වැසිකිළි හා කැසිකිලි පවිත්‍ර කිරීමේ කාර්යයන් ඇතුලුව පිරිසිදු කිරීමේ කාර්යයන්. | PL 01 - 2016 රු. 24,250 - 10x250 - 10 x 270 - 10 x 300 -12 x 330 - රු. 36,410/- | අධ්‍යාපන සුදුසුකම් :<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථා වලදී 5 ශ්‍රේණිය සමත් අයවළුන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 05. | ආදාහනාගාර සහායක III වන ශ්‍රේණිය | 01 | නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව<br><br>ආදාහනාගාරයේ කාර්යයන්ට සහාය වීම | PL 01 - 2016 රු. 24250 - 10x250 - 10 x 270 - 10 x 300 -12 x 330 - රු. 36,410/- | අධ්‍යාපන සුදුසුකම් :<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නො-වැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂය-යන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. |
| 06. | පුස්තකාල සහායක III වන ශ්‍රේණිය | 03 | නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව<br><br>පුස්තකාලය පිරිසිදු කිරීම, පොත්පත් ඇසිරීම, පොත්පත් ශාඛාවලට ගෙන යාමේ දී සහායක කටයුතු, පොත් බැඳීමට සහාය වීම, පුස්තකාල හා කියවීම් ශාලා පවත්වාගෙන යාම. | PL 01 - 2016 රු. 24250 - 10x250 - 10 x 270 - 10 x 300 -12 x 330 - රු. 36,410/- | අධ්‍යාපන සුදුසුකම්<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. |
| 07 | කාර්යාල කාර්යය සහායක III වන ශ්‍රේණිය | 03 | නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව<br>දුරකථන ක්‍රියාකරු වශයෙන් ක්‍රියා කිරීම, පොත් බැඳීමේ කාර්ය හෝ ලේඛන භාරකරු වශයෙන් ක්‍රියා කිරීම.<br>හෝ<br>ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියාකරු වශයෙන් ක්‍රියා කිරීම හෝ බයිසිකල් පණිවුඩකරු<br>හෝ<br>පණිවුඩකරු කාර්යයයේ නිරත වීම හෝ පිළිගැනීමේ නිලධාරි වශයෙන් ක්‍රියා කිරීම.<br>හෝ<br>කාර්යාල කාර්යය සහායක වශයෙන් කාර්යාල අභ්‍යන්තරයේ ක්‍රියා කිරීම<br>හෝ<br>බාහිර කාර්යාල කාර්යය සහායක වශයෙන් කාර්යාලයේ අභ්‍යන්තරයේ සහ බාහිරව ක්‍රියා කිරීම<br>හෝ<br>සෝපාන යන්ත්‍ර ක්‍රියාකරු වශයෙන් ක්‍රියා කිරීම<br>හෝ<br>ලේඛණාගාර සහායක වශයෙන් ක්‍රියා කිරීම. | PL 03 - 2016 රු. 24250 - 10x250 - 10 x 270 - 10 x 300 -12 x 330 - රු. 36,410/- | අධ්‍යාපන සුදුසුකම්<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 08. | මුරකරු III වන ශ්‍රේණිය | 03 | නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව<br><br>පළාත් පාලන ආයතනය සතු දේපල ගොඩනැගිලි සහ වාහන ආදිය ආරක්ෂා කිරීම | PL 1 - 2016 රු. 24,250 - 10x250 - 10 x 270 - 10 x 300 -12 x 330 - රු. 36,410/- | *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. |
| 09. | විදුලි කාර්මික III වන ශ්‍රේණිය | 01 | නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව<br><br>තනතුරට අදාළව හා අවශ්‍යතාවය මත ආයතන ප්‍රධානියා විසින් තීරණය කර පවරන්නා වූ රාජකාරි | PL 2 - 2016 රු. 25,250 - 10x270 - 10 x 300 - 10 x 330 -12 x 350 - රු. 38,450 | *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබිය යුතුය.<br><br>*ශිල්පීය නිපුනතා / ප්‍රවීණතා :*<br><br>වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 02 වන මට්ටමේ (NVQ 2) හෝ 3 වන මට්ටමේ (NVQ 3) සහතිකය ලබා තිබීම.<br><br>හෝ<br><br>කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලා-වක් හදාරා සහතික ලබා තිබීම.<br><br>හෝ<br><br>ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br><br>හෝ<br><br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.<br><br>හෝ<br><br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAI-TA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.<br><br>හෝ<br><br>. |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| | | | | | තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br><br>*පළපුරුද්ද :*<br><br>අදාළ ක්ෂේත්‍රයේ අවුරුදු 02ක පළපුරුද්දක් ලබා තිබීම. |

*02. බඳවා ගැනීමේ කොන්දේසි :*

(i) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ii) අයදුම්කරුවන් මනා මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර තුනක කාලයක් නෝර්වුඩ් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(iv) අයදුම්පත් කැඳවන් අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක ස්ථිර සේවයේ නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(v) ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදාළව ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(vi) බඳවා ගැනීමේ පටිපාටිය අනුව විධිමත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහිදී ලබාගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගැනේ.

(vii) රියදුරු තනතුර සඳහා ඉල්ලුම් කරන අය ලිඛිත පරීක්ෂණයකට ඉදිරිපත් විය යුතු අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති හා ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.
සීමිත බඳවා ගැනීමේ දී කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් (අර්ධ ශිල්පීය හා ශිල්පීය නොවන තනතුරු සඳහා) මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයකදී සුදුසුකම් ලබා ගත යුතුය.

(viii) අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

(ix) දැනටමත් නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක, දීමනා, කොන්ත්‍රාත් හෝ කුළී පදනම යටතේ සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලබන අතර, ඔවුන් ආයතන ප්‍රධානියා මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

(x) තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලට ද පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලට ද නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව දැනට පනවා ඇති හා පනවනු ලබන නීතිවලට හා එකී නීති රීති සියල්ලට යටත් විය යුතුය.

(xi) මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු හා අනන්දරු අරමුදලට දායකත්වය හිමිවේ.
(iii) බඳවා ගනු ලබන අය වසර 03 ක පරිවාස කාලයකට යටත් ය. එම කාලය තුලදී වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.
(iv) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා දිය යුතුය.
(v) බඳවා ගැනීමේ කොන්දේසි වලට අමතරව ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ බඳවා ගැනීම සඳහා වන අනෙකුත් පොදු කොන්දේසි වලට යටත් විය යුතුය.
(vi) යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර කවර බල ප්‍රදේශයක් තුළ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශාරීරික සෞඛ්‍යකින් යුක්ත තැනැත්තෙකු විය යුතුය.
(vii) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
(viii) රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය. නෝර්වුඩ් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කෙරෙන ස්ථාන මාරුවීම් වලට යටත් වේ.
(ix) සේවයේ අකාර්යක්ෂමතාවයක් හෝ අසතුටුදායක තත්වයක් පෙනී ගියහොත් සභාවේ මනාපය පරිදි සේවය අවසන් කිරීමේ බලය ප්‍රාදේශීය සභාව සතුය.

04. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම්කරන තනතුර සඳහන් කර 2019 පෙබරවාරි 01 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. තැපෑලේදී නැති වන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවෙන අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමඟ පහත සඳහන් ලිපි ලේඛන වල සහතික කළ පිටපත් අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය,
(ii) ජාතික හැඳුනුම්පත,
(iii) අධ්‍යාපන සහතික,
(iv) ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ යුතුය),
(v) වෘත්තීය සුදුසුකම් දක්වෙන සහතික,
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
(vii) මෑතකදී ලබා ගත් චරිත සහතික 02.

ඒ. ප්‍රියදර්ශිනි,
ලේකම්,
නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව,
පුලියාවත්ත.

2019 ජනවාරි මස 04වැනි දින,
නෝර්වුඩ් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව**

**............................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. සම්පූර්ණ නම :————————————
2. ලිපිනය :————————————
3. දුරකථන අංකය :————————————
4. උපන් දිනය :————————————
5. ජාතික හැඳුනුම්පත් අංකය :————————————
(ඡායා පිටපතක් ඇමිණිය යුතුය.)

6. 2019.02.01 දිනට වයස :——————————

7. පුරවැසිභාවය :——————————

8. විවාහක ද? අවිවාහක ද? යන වග :——————————

9. දැනට තනතුරක් දරන්නේ නම් එම විස්තර :

(i) එම තනතුරේ නම :——————————
(ii) එයට පත් වූ දිනය :——————————
(iii) පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික) :——————————
(iv) මැතිවරණ කොට්ඨාසය :——————————
(v) පළපුරුද්ද හා සේවා කාලය :——————————

10. *අධ්‍යාපන සුදුසුකම් :*

(සමර්ථ වී ඇති උපරිම ශ්‍රේණිය සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
අ. පො. ස. (සා.පෙළ) විභාගය සමත් වර්ෂය :-.................................... විභාග අංකය :- ......................................

| අනු අංකය | විෂයය | සාමාර්ථය | අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

11. වෘත්තීය සුදුසුකම් ——————————

12. වෙනත් සුදුසුකම්:—————————— (තාක්ෂණික දැනුම පිළිබඳ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :——————————

15. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්තව සිටී ද? ඔව්/ නැත:——————————

ඔව් නම් දැනට තනතුර හා එම තනතුරට පත් වූ දිනය :——————————

ඉහත සඳහන් අංක 01 - 14 දක්වා කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරන අතර යම් විටක දී මෙම තොරතුරු අසත්‍ය බව හෙළි වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව තේරුම් ගෙන ඇති බවත්, ඉල්ලුපත්‍ර කැඳවීමේ කොන්දේසි වලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

දිනය :——————————

අයදුම්කරුගේ අත්සන

**දැනට රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන ............................................ යන අය මෙම ආයතනයේ .................................................. වශයෙන් ................................ ......... දින සිට සේවය කරනු ලබයි. ඉල්ලා ඇති තනතුරට තෝරා ගතහොත් ඔහු/ ඇය දැනට තනතුරෙන් නිදහස් කළ හැක./ නොහැක. ඔහු/ ඇය කිසිම නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඇති ඉදිරිපත් කරමි.

දිනය:——————————

——————————
ආයතන ප්‍රධානියාගේ අත්සන
නිල මුද්‍රාව

නම :——————————
තනතුර :——————————
ආයතනය :——————————

01 - 403

## වාරියපොල ප්‍රාදේශීය සභාව

### වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

වාරියපොල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව ඇති පහත උපලේඛනයේ සඳහන් ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයට අයත් තනතුරු සඳහා වයඹ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2008.11.19 දිනැතිව හා අර්ධ ශිල්පීය ගණයට අයත් තනතුරු සඳහා වයඹ ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2009.05.12 දිනැතිව අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වසර 03කට වඩා වැඩි කාලයක් ඇති ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | සේවක ගණය | ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය |
|---|---|---|---|---|
| 01. වැඩ/ ක්ෂේත්‍ර කම්කරු (මාර්ග) | ප්‍රාථමික (ශිල්පීය නොවන) | III | 03 | 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව<br>PL1 - 2016<br>රු. 24,250 - 10x250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410/- |
| 02. පුස්තකාල උපස්ථායක | ප්‍රාථමික (ශිල්පීය නොවන) | III | 01 | 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව<br>PL1 - 2016<br>රු. 24,250 - 10x250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410/- |

01. වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මාර්ග) හා පුස්තකාල උපස්ථායක තනතුරු සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :-

I. අධ්‍යාපන සුදුසුකම් :-
අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයය හැර)

II. බඳවා ගැනීමේ ක්‍රමය :-

මූලික සුදුසුකම් සපුරා ඇති අය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්ෂණයේ ප්‍රථිපල මත සුදුසුකම් ලත් අය බඳවා ගනු ලැබේ.

III. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :-

මෙම තනතුරු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ව තෝරාගනු ලැබේ. එම කාලය තුල සිය රාජකාරි වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ.

චක්‍රලේඛ විධිවිධාන පරිදි වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

IV. පොදු කොන්දේසි (සියළුම තනතුරු සඳහා)

1. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය.
2. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
3. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
4. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

5. වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරියාගෙන් ලබා ගන්නා ලද ග්‍රාම නිලධාරි සහතිකය අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර සනාථ කළ යුතුය.

6. අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය වාරියපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

V. ප්‍රාදේශීය සභාවේ සිථිර සේවයේ නියුතු අයෙක් හෝ අනියම්/ ආදේශක / තාවකාලික සේවයේ යෙදී සිටින අයෙකුට නම් වයස් සීමාව බලනොපාන අතර, ඔහු/ ඇය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලැබීමක් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

VI. *අයදුම්පත් එවිය යුතු පිළිවෙල :*

සියලුම අයදුම්කරුවන් මෙහි පහතින් ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2019.02.08 දිනට පෙර ලේකම්, ප්‍රාදේශීය සභාව, වාරියපොල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික වල අනුපිටපත් ඇමිණිය යුතුයි :

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතිකය
3. ජාතික හැඳුනුම්පතෙහි පිටපත
4. ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය,

වයි. එම්. සේනානායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, වාරියපොළ.

2019 ජනවාරි මස 01 වැනි දින,
වාරියපොළ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**වාරියපොළ ප්‍රාදේශීය සභාවේ ..................................................... තනතුරු සඳහා වූ අයදුම්පත්‍රය**

01. මුලකුරු සමග නම :——————————————.

මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————.

02. පෞද්ගලික ලිපිනය :——————————————.

03. උපන් දිනය :- අවුරුද්ද :————, මාසය :————, දිනය :————,

(අ) 2019.01.01 දිනට වයස අවුරුදු :————, මාස :————, දින :————,

04. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————————.

05. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? :——————————————.

06. ස්ත්‍රී / පුරුෂභාවය :——————————————.

07. විවාහක / අවිවාහක බව :——————————————.

08. සමත්ව ඇති ඉහළම විභාගය :——————————————

09. ශිල්පීය නිපුණතා :——————————————.

10. වෘත්තීය සුදුසුකම් :——————————.

11. ඔබට විරුද්ධව උසාවියකින් දඬුවම් පනවා තිබේ ද?:——————————.

12. එසේ නම් දඬුවමේ ස්වභාවය :——————————.

13. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :——————————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදිවූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍යය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

..............................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

01 - 397

---

## හැටන් දික්ඔය නගර සභාව

### ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය හා ශිල්පීය නොවන තනතුරු සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ හැටන් දික්ඔය නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති හැටන් දික්ඔය නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් 2019.02.08 දිනට පෙර "ලේකම්, හැටන් දික්ඔය නගර සභාව, හැටන්" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ විසින් ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතු ය. තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේ නම් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමු කළ යුතු ය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | රියදුරු III වන ශ්‍රේණිය | 03 | හැටන් දික්ඔය නගර සභාව<br><br>ප්‍රවාහනය සම්බන්ධ කාර්යයන්ගෙන් සමන්විත වන කාර්යභාරයක් හා ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන රාජකාරි | PL – 03 2016<br>රු. 25,790-10×270 -10×300 -10×330-12×350<br>රු. 38,990 | අධ්‍යාපන සුදුසුකම් :<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br><br>තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන බර ටේලර් සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම්<br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ඒ1/ඒ/බී1/බී/සී1/සී/සීඉ1/ඩී1/ඩී/ජී1/ජී/ජේ පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම. |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| | | | | | *පළපුරුද්ද :*<br>මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය)<br>*කායික සුදුසුකම් :*<br>අවම උස අඩි 05 අඟල් 2 1/2 ක් විය යුතුය.<br>මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br>මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය. |
| 02 | මාර්ග කම්කරු III වන ශ්‍රේණිය | 11 | හැටන් දික්ඔය නගර සභාව<br>මාර්ග දෙපස කාණු පවිත්‍ර කිරීම, තණකොළ කැපීම, කහ ඉරි ඇඳීමට සහය වීම, තාර දැමීම, ප්‍රිමික්ස් සැකසීමට අත් උදව් දීම, මාර්ග අතු ගෑම, පිරිසිදු කිරීම, ගලි යන්ත්‍රයේ කාර්යයන්, කසල එකතු කර ට්‍රැක්ටර්වලට දැමීම, පොදු වැසිකිලි හා කැසිකිලි පවිත්‍ර කිරීමේ කාර්යයන් ඇතුළුව පිරිසිදු කිරීමේ කාර්යයන් | PL – 1 2016<br>රු. 24,250-10×250 -10×270 -10×300-12×330<br>රු. 36,410 | *අධ්‍යාපන සුදුසුකම් :*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථා වලදී 5 ශ්‍රේණිය සමත් අයවළුන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 03 | සෞඛ්‍ය කම්කරු III වන ශ්‍රේණිය | 13 | හැටන් දික්ඔය නගර සභාව<br>මාර්ග දෙපස කාණු පවිත්‍ර කිරීම, තණකොළ කැපීම, කහ ඉරි ඇඳීමට සහය වීම, තාර දැමීම, ප්‍රිමික්ස් සැකසීමට අත් උදව් දීම, මාර්ග අතු ගෑම, පිරිසිදු කිරීම, ගලි යන්ත්‍රයේ කාර්යයන්, කසල එකතු කර ට්‍රැක්ටර්වලට දැමීම, පොදු වැසිකිලි හා කැසිකිලි පවිත්‍ර කිරීමේ කාර්යයන් ඇතුළුව පිරිසිදු කිරීමේ කාර්යයන් | PL – 1 2016<br>රු. 24,250-10×250 -10×270 -10×300-12×330<br>රු. 36,410 | *අධ්‍යාපන සුදුසුකම් :*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවල 5 ශ්‍රේණිය සමත් අයවලුන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 04 | රථ වාහන පාලිකා III වන ශ්‍රේණිය | 02 | හැටන් දික්ඔය නගර සභාව<br><br>වීථිවල නවතා තබන වාහන වලින් ගාස්තු අය කිරීම හා එම ගාස්තු දිනපතා නිවැරදිව අධීක්ෂණ අංශයට භාර දීම හා ඒ ආශ්‍රිත කටයුතු | PL – 1 2016 රු. 24,250- 10×250 -10×270 -10×300-12×330 රු. 36,410 | *අධ්‍යාපන සුදුසුකම් :*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය. |
| 05 | බර යන්ත්‍ර ක්‍රියාකරු (කොන්ත්‍රාත් පදනම මත) | 01 | හැටන් දික්ඔය නගර සභාව<br><br>ජේ.සී.බී. යන්ත්‍රයේ කටයුතු හා එහි නඩත්තු කටයුතු | PL – 03 2016 රු. 25,790 -10×270-10×300- 10×330-12×350 - රු. 38,990 | *අධ්‍යාපන සුදුසුකම් :*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br>තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ටේලර් සහ මගින් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියැදුරු බලපත්‍රයක් එනම් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව ඒ1/ඒ/බී1/බී/සී1/සී/සීඉ/ඩී1/ඩී/ ජී1/ජී/ජේ පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.<br><br>රජයේ ආයතනයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් වෘත්තීය පුහුණුව පිළිබඳ අනුමත සහතිකයක් ලබා තිබීම.<br><br>*පළපුරුද්ද :*<br>මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය)<br><br>*කායික සුදුසුකම් :*<br>අවම උස අඩි 05 අඟල් 02 1/2 ක් විය යුතුය. මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br><br>මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය. |

02. *බඳවා ගැනීමේ කොන්දේසි :*

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
2. අයදුම්කරුවන් මනා මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර තුනක කාලයක් හැටන් දික්ඔය සහා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
4. අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක ස්ථිර සේවයේ නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ)
5. ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදළව ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.
6. බඳවා ගැනීමේ පටිපාටිය අනුව විධිමත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහිදී ලබාගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගැනේ.
7. රියැදුරු තනතුරු සඳහා ඉල්ලුම් කරන අය ලිඛිත පරීක්ෂණයකට ඉදිරිපත් විය යුතු අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති හා ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

   රියැදුරු තනතුරු සඳහා සීමිත බඳවා ගැනීමේ දී කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයක දී සුදුසුකම් ලබා ගත යුතුය.
8. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය හැටන් දික්ඔය නගර සභාවේ ලේකම් සතු වේ.
9. දැනටමත් හැටන් දික්ඔය නගර සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක, දීමනා , කොන්ත්‍රාත් හෝ කුලී පදනම යටතේ සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලබන අතර, ඔවුන් ආයතන ප්‍රධානියා මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
10. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලටද පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලට ද හැටන් දික්ඔය නගර සභාව දැනට පනවා ඇති හා පනවනු ලබන නීතිවලට හා එකී නීති රීති සියල්ලට යටත් විය යුතුය.
11. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.
12. බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම සිදු කරන අතර ගිවිසුම් කාලය අවම වශයෙන් වසර දෙකකි.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.
3. බඳවා ගනු ලබන අය වසර 03 ක පරිවාස කාලයකට යටත්ය. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.
4. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා දිය යුතුය.
5. බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ බඳවා ගැනීම සඳහා වන අනෙකුත් පොදු කොන්දේසිවලට යටත් විය යුතුය.
6. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර කවර බල ප්‍රදේශයක් තුළ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත තැනැත්තකු විය යුතුය.
7. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබුවකු නොවිය යුතුය.
8. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබුවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය. හැටන් දික්ඔය නගර සභා බල ප්‍රදේශය තුළ කෙරෙන ස්ථාන මාරුවීම්වලට යටත් වේ.
9. සේවයේ අකාර්යක්ෂමතාවයක් හෝ අසතුටුදායක තත්වයක් පෙනී ගියහොත් සභාවේ මනාපය පරිදි සේවය අවසන් කිරීමේ බලය සභාව සතුය.

04. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම්කරන තනතුර සඳහන් කර 2019.02.08 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලේකම්, හැටන් දික්ඔය නගර සභාව, හැටන් යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. තැපෑලේදී නැති වන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවෙන අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් ලිපි ලේඛණවල සහතික කළ පිටපත් අමුණා එවිය යුතුය :

1. උප්පැන්න සහිතකය
2. ජාතික හැඳුනුම්පත
3. අධ්‍යාපන සහතික
4. ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ යුතුය)
5. වෘත්තීය සුදුසුකම් දක්වෙන සහතික
6. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික
7. මෑතකදී ලබා ගත් චරිත සහතික 02

ඒ. සරවනබවන්,<br>
ලේකම්,<br>
හැටන් දික්ඔය නගර සභාව.

**හැටන් දික්ඔය නගර සභාවේ ........................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය.**

01. සම්පූර්ණ නම :——————————
02. ලිපිනය :——————————
03. දුරකථන අංකය :——————————
04. උපන් දිනය :——————————
05. ජාතික හැඳුනුම්පත් අංකය :——————————
06. 2019.02.08 දිනට වයස :——————————
07. පුරවැසිභාවය :——————————
08. විවාහක/ අවිවාහක බව :——————————
09. දැනට තනතුරක් දරන්නේ නම් එම විස්තර
    (i) තනතුරේ නම :——————————
    (ii) එයට පත් වූ දිනය :——————————
    (iii) පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික) :——————————
    (iv) මැතිවරණ කොට්ඨාශය :——————————
    (v) පළපුරුද්ද හා සේවා කාලය :——————————

10. අධ්‍යාපන සුදුසුකම් :

(සමර්ථ වී ඇති උපරිම ශ්‍රේණිය සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වර්ෂය :...................................... විභාග අංකය :................................................

| අනු අංකය | විෂයය | සාමාර්ථය | අනු අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

11. වෘත්තිය සුදුසුකම් :——————————
12. වෙනත් සුදුසුකම් :——————————
(තාක්‍ෂණික දැනුම පිළිබඳ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)
13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? :——————————
14. ඔබ දැනටමත් මෙම සභාවේ සේවයේ නියුක්තව සිටි ද? ඔව්/නැත :——————————
ඔව් නම් දැනට දරන තනතුර හා එම තනතුරට පත් වූ දිනය :——————————

ඉහත සඳහන් අංක 01 - 14 දක්වා කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරන අතර යම් විටකදී මෙම තොරතුරු අසත්‍ය බව හෙළි වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව තේරුම්ගෙන ඇති බවටත්, ඉල්ලුම්පත්‍ර කැඳවීමේ කොන්දේසිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

දිනය : .........................

...................................................
අයදුම්කරුගේ අත්සන

*දැනට රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය.*

මෙම ඉල්ලුම්කරු වන ................................................ යන අය මෙම ආයතනයේ ............................... වශයෙන් .............................................. ... දින සිට සේවය කරනු ලබයි. ඉල්ලා ඇති තනතුරට තෝරා ගතහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කිසිම නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය : ...........................

................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
නිල මුද්‍රාව

නම :——————————
තනතුර :——————————
ආයතනය :——————————

01 - 347

## පළාත් පාලන නිවේදන

### රත්නපුර මහා නගර සභාව

2ව019 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

රත්නපුර මහා නගර සභාව විසින් 2018 වර්ෂයේ දෙසැම්බර් මස 07 වැනි දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ තීරණ අංක 05 : 10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද, ඒ ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර රත්නපුර මහා නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ටී. එච්. අත්තනායක,
නගරාධිපති,
රත්නපුර මහා නගර සභාව

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
රත්නපුර මහා නගර සභාවේ දී ය.

"252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 247 ඈ වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් මහා නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, රත්නපුර මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසුවන විටෙක හෝ යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි විටෙක,

(අ) ඒ ඉඩමෙහි ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ

(ආ) ඒ ඉඩමෙන් ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යට වී ඇති ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය, යෝජනා සම්මතයක් මගින් සභාව විසින් නියම කරනු ලැබූ නියමිත අනුපාතයට වඩා අඩු වන්නේ නම්, හෝ

(ඇ) ස්ථාවර *නැතහොත්* නිතිපතා කෙරෙන ගොවිතැනට ඒ ඉඩම යොදවා නැත්නම්,

එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත ඒ වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 2% ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර රත්නපුර මහා නගර සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යැයි රත්නපුර මහා නගර සභාව යෝජනා කරන්නී ය.

01 - 373 / 1

---

**රත්නපුර මහා නගර සභාව**

2019 වර්ෂය සඳහා වීථියේ වෙළෙඳාම තහනම් කිරීම

රත්නපුර මහා නගර සභාව විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 09 වැනි දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ තීරණ අංක 05 : 03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන මෙම නියෝගය 2019 වසරේ දෙසැම්බර් මස 31 වැනි දින දක්වා බල පැවැත්වෙන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ටී. එච්. අත්තනායක,
නගරාධිපති,
රත්නපුර මහා නගර සභාව

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
රත්නපුර මහා නගර සභාවේ දී ය.

**තීරණය**

"252 වැනි අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ VII වැනි කොටසේ 159 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව යම් නිශ්චිත වීථියක හෝ එහි යම් කොටසක යම් භාණ්ඩයක් වෙළෙඳාම හෝ වෙළඳාම සඳහා තැබීම *ගැසට් පත්‍රයේ* පලකරන නි-වේදනයක් මඟින් මහා නගර සභාව විසින් කලින් කල තහනම් කළ හැකි අතර ඒ තහනම අවලංගු කිරීම අත්හිටුවීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම ද ඒ ආකාරයෙන් ම කළහැකි ය. ඒ නිවේදනයෙන් පසුව එවැනි යම් වීථියක ඒ නිවේදනය කඩකරමින් යම් භාණ්ඩයක් වෙළඳාම් කරන හෝ වෙළෙඳාම් සඳහා තබන සෑම තැනැත්තෙකුම වරදක් කරන අතර වරදකරු ලෙස අදාළ දඩුවමට යටත් විය යුතු බවට රත්නපුර මහා නගර සභාව යෝජනා කරන්නී ය.

10 - 373 / 2

---

**මාවතගම ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) හා 24 (2) වැනි වගන්ති යටතේ කරනු ලබන දැන්වීමයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර වයඹ පළාත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය සභාව විසින් මෙහි සඳහන් කර ඇති මාර්ගය මාවතගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම මාර්ගය සම්බන්ධයෙන් අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධතාවයක් පළකරනු ලබන්නේ නම් මේ නිවේදනයේ සිට මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකාර ක්‍රියාකරන ලෙස මෙයින් දැනුම් දෙමි.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මාර්ගය ප්‍රාදේශීය සභාව සතු මාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ගොඩනැගිලි සීමාව මාර්ග මධ්‍යයේ සිට අඩි 25 බලපැවැත්වේ.

එස්. කේ. අනුර කමල් පෙරේරා,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මාවතගම.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

01. පරගහදෙනිය කොට්ඨාසය - දෙල්පද්දන

| | | |
|---|---|---|
| පාරේ නම | - | දෙල්පද්දන දෙණියවත්ත මාර්ගය |
| ආරම්භය | - | ආරියසිංහ මහතාගේ ඉඩම |
| අවසානය | - | සෝමරත්න මහතාගේ නිවස |
| පාරේ දිග | - | මීටර් 150 |
| පාරේ පළල | - | අඩි 10 |
| මානකතැනගේ නම | - | එම්. ඩබ්ලිව්. ආරියරත්න |

*පාරේ දකුණු පස හිමියන්*

01. ජී. ඩී. ආර්. ගුණරත්න මයා.
02. ජී. ඩී. සෝමරත්න මයා.
03. එස්. එම්. රාසික් මයා.

*වම්පස හිමියන්*

01. ඊ. ඩී. ජී. නිහාල් ප්‍රේමතිලක මයා.
02. කේ. ඩී. ආරියසිංහ මයා.
03. ඩී. ඩබ්ලිව්. දයා සෝමලතා මිය.
04. ආර්. ඩී. එස්. රණසිංහ මිය.

01 - 372

---

**බළන්ගොඩ නගර සභාව**

ගෝ ඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයන්හි සවිස්තරාත්මකව දක්වා ඇති ස්ථානයේ මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 2019 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍රය නිකුත් කිරීම සඳහා බළංගොඩ නගර සභා සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින දාහතරක් (14) ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බවත්, ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 272 වැනි අධිකාරය *හෙවත්* ගෝ ඝාතක ආඥාපනතේ
7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව

2018 දෙසැම්බර් මස 28 වැනි දින,

බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය 01**

| අනු. අංකය | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළෙඳාම් කරන ස්ථානය | වෙළඳාමේ ස්වභාවය |
|---|---|---|---|
| 01 | අබ්දුල් මුන්නාලිෆ් මොහොමඩ් රෙම්ෂින්, අංක 45, කහටපිටිය, බළන්ගොඩ | පොදු වෙළෙඳසල අංක 15 දරන එළු මස් කඩය | එළු මස අළෙවිය |
| 02 | මොහොමඩ් ෆලීල් මොහොමඩ් රවුෂාන්, අංක 45, කහටපිටිය පාර, මිරිස්වත්ත, බළන්ගොඩ | පොදු වෙළෙඳසල අංක 16 දරන එළ හරක් මස් කඩය | එළ හරක් මස් අළෙවිය |
| 03 | අබ්දුල් මුන්නාලිෆ් මොහොමඩ් රෙම්ෂින්, අංක 45, කහටපිටිය, බළන්ගොඩ | පොදු වෙළෙඳසල අංක 17 දරන කුකුල් මස් කඩය | කුකුල් මස් අළෙවිය |

**උපලේඛනය 02**

| අනු. අංකය | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ගෝඝාතකාගාරය පවත්වාගෙන යනු ලබන ස්ථානය |
|---|---|---|
| 01 | මොහොමඩ් ෆලීල් මොහොමඩ් රවුෂාන්, අංක 45, කහටපිටිය පාර, බළන්ගොඩ | බළන්ගොඩ කහටපිටිය පාර වරිපනම් අංක 51/3 දරන ස්ථානය |

01 - 322

**කැස්බෑව නගර සභාව**

255 අධිකාරය වන 1939 අංක 61 නගර සභා ආඥාපනතේ 52 වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීම

255 අධිකාරය වන 1939 අංක 61 නගර සභා ආඥාපනතේ 52 වගන්තිය ප්‍රකාර බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැස්බෑව නගර සභා සීමාවේ පිහිටි මෙයට යාකොට ඇති උපලේඛනයේ දක්වා ඇති අංක 1 සිට 5 දක්වා මංමාවත් කැස්බෑව නගර සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**උපලේඛනය**

| අනු. අංකය | පාරේ නම | පාරේ දිග | පාරේ පළල | ආරම්භක වරිපනම් අංකය | අවසාන වරිපනම් අංකය |
|---|---|---|---|---|---|
| 01 | ගොරකපිටිය ඇළපහල පාරෙන් මහයාය වත්ත පාරේ 2 පටුමග | මීටර් 54 | මීටර් 3.65 ත් 4.5 | 71/3/ඒ මිහිඳුපුර පාර | 101/47 මිහිඳුපුර පාර |
| 02 | නාම්පමුණුව පන්සල පාරේ එකමුතු පෙදෙස | මීටර් 92 | මීටර් 3.65 | 241 පන්සල පාර | 235/19 පන්සල පාර |
| 03 | නාම්පමුණුව පන්සල පාරේ ඉසුරු උයන ප්‍රවේශ මාර්ගය | මීටර්77 | මීටර් 3.65 | 216 පන්සල පාර | 216/09 පන්සල පාර |
| 04 | හොන්නන්තර උතුර විජයනන්දනාරාම පාරේ 06 වන මාවතට ඉදිරියෙන් ඇති අතුරු මාර්ගය | මීටර් 42 | මීටර් 5.50 | 96/6 විජයනන්-දනාරාම පාර | 96/18 විජයනන්දන-ාරාම පාර |
| 05 | නාම්පමුණුව සල් මල් මාවත, 2 පටුමග | මීටර් 85 | මීටර් 4.50 | 39 සල්මල් මාවත | 37/12 සල්මල් මාවත |

ලක්ෂ්මන් පෙරේරා,
සභාපති,
කැස්බෑව නගර සභාව

2018 ඔක්තෝබර් මස 30 වැනි දින,
කැස්බෑව නගර සභා කාර්යාලයේ දී ය.

01 - 439

## පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව

### පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභා මායිම තුළ පිහිටා ඇති පහත සඳහන් ප්‍රදේශය ගොඩනැගිලි පිහිටි ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම

1987 වර්ෂයේ අංක 15 වන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය අනුව පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටා ඇති වූ ද, පහත දක්වා ඇති ලේඛනයේ සඳහන් කර ඇති වූද, ග්‍රාම නිලධාරි වසම ගොඩනැගිලි පිහිටන ලද ස්ථාන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන බව 2017 වර්ෂයේ ජුනි මස 30 වැනි දිනැති අංක 239 දරන පරිපාලන නියෝග යටතේ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන ලදී. පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ ගොඩනැගිලි පිහිටා ඇති ප්‍රදේශය ලෙස 2018.12.07 වන දින සිට ක්‍රියාත්මක වන සේ ඉහත පනත අනුව, ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය වෙත පවරන ලද අධිකාරි බලය යටතේ මුලතිව් පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් ජේ. රාජමල්ලිකෙ වන මා අනුමැතිය ලබා දී මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ජේ. රාජමල්ලිකෙ
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,
මුලතිව් දිස්ත්‍රික්කය

2018 නොවැම්බර් මස 26 වැනි දින,
මුලතිව්,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

| *අනු. අංකය* | *කොට්ඨාසයේ නම* | *ග්‍රාම නිලධාරි වසම* | *ග්‍රාම නිලධාරි වසම් අංකය* | *ග්‍රාම නිලධාරි වසම Sq. KM* | *වට්ටාරමේ (මායිම) සීමාව* |
|---|---|---|---|---|---|
| 1 | කෝම්පාවිල් අංක - 05 | 1. කෝම්පාවිල් | මුල්/42 | 10.3 | *උතුර* - දේවිපුරම් ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර හා මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභා සීමාව<br>*නැගෙනහිර* - ඉරණපලේආනන්තපුරම් හා සිවනහර ග්‍රාම නිලධාරි වසම්වල බටහිර සීමා<br>*දකුණ* - පුදුකුඩියිරුප්පු බටහිර ග්‍රාම නිලධාරි වසමේ උතුරු සීමාව<br>*බටහිර* - දේවිපුරම් ග්‍රාම නිලධාරි වසමේ දකුණු හා නැගෙනහිර සීමා |
| 2 | පුදුකුඩියිරුප්පු අංකය - 07 | 1. පුදුකුඩියිරුප්පු නැගෙනහිර<br>2. පුදුකුඩියිරුප්පු බටහිර | මුල්/36<br>මුල්/41 | 19.4<br>27.8 | *උතුරට* - තේවිපුරම් සහ කොම්බාවිල් ග්‍රාම නිලධාරි වසම්වල දකුණු මායිම්<br>*නැගෙනහිර* - සිවනගර්, මන්තුවිල්, හා මල්ලිකායිතිව් ග්‍රාම නිලධාරි වසම්වල බටහිර මායිම් සහ මුහුදුබඩ පත්තු ප්‍රාදේශීය සභා මායිම<br>*දකුණට* - පෙරාරු, කට්විලයිමඩු සහ කනගරාතිනපුරම් ග්‍රාම නිලධාරි වසම්වල උතුරු මායිම්<br>*බටහිරට* - වල්ලිපුනම් ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම |
| | | | | | |


KOMBAVIL, PUTHUKKUDIYIRUPPU EAST & PUTHUKKUDIYIRUPPU WEST GN MAP
KOMBAVIL
PUTHUKKUDIYIRUPPU EAST
PUTHUKKUDIYIRUPPU WEST
Legend

## උකුවෙල ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථා

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු සම්මත ව්‍යවස්ථා පනත**

261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (03) උප වගන්ති ප්‍රකාරව පහත සඳහන් තීරණය මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ඩබ්. එම්. චේතියරත්න,
සභාපති,
උකුවෙල ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 25 වැනි දින,
උකුවෙල ප්‍රාදේශීය සභාවේ දී

*තීරණය*

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මධ්‍යම පළාත්, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 වැනි දින අංක 1955/ 7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ පළකරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කොට 2017.05.05 වැනි දින අංක 2017/ 42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද්දා වූ පහත සඳහන්කොට ඇති අතුරු ව්‍යවස්ථා.

1. ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදි කිරීම සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව.
2. සේවා සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
3. ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
4. මහජන පුස්තකාල පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව
5. සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව
6. ආදාහනාගාර පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව
7. බදු අය කර ගැනීමේ කාර්යය සඳහා වූ වාර වාර්තා හා තොරතුරු ලබා ගැනීමේ අතුරු ව්‍යවස්ථාව
8. පීඩාකාරී ව්‍යාපාර අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා
9. මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
10. ප්‍රාදේශීය සභා පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථා
11. සැරසිලි විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථා
12. පොදු වැසිකිලි පාවිච්චිය විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථා
13. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා
14. කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
15. මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
16. පෞද්ගලික ඉගෙනුම් ආයතන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
17. ගෝඝාතකාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක කිරීමටත් ඊට පෙර දින සිට මධ්‍යම රාත්‍රී සිට මීට පෙර ඉහතින් සඳහන් කරන්නට යෙදුන අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් උකුවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක වූ සියලුම අතුරු ව්‍යවස්ථා අවලංගු කිරීමටත් හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (03) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018.10.25 දින 5.1.2 වැනි තීරණ අංක යටතේ මෙයින් තීරණය කරමි.

01-752

---

## මාතර මහා නගර සභාව

### 1957 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත

මෙකී පහත උපලේඛනයේ නම සඳහන් තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දක්වෙන සමාජශාලාව එහි සඳහන් ස්ථානයෙහි පැවත්වීම සඳහා 2019 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීම සඳහා මා වෙත ඉල්ලුම්පත් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජශාලා වලට බලපත්‍ර දීමේ පනතේ (6) වැනි වගන්තියේ (ඇ) ඡේදය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලා අසල හෝ එකී සමාජ ශාලා සඳහා අපේක්ෂිත ස්ථානය අදාළ හෝ පදිංචි යම් තැනැත්තෙකු එම ක්‍රීඩා සමාජශාලා සඳහා බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට සති 04 ක් ඇතුලත තමාගේ විරුද්ධත්වයට හේතු ලිඛිතව පිටපත් 02න් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දනුම් දෙනු ලැබේ.

සේනක පල්ලියගුරුගේ,
නාගරික කොමසාරිස්,
මාතර මහා නගර සභාව.

2019 ජනවාරි මස 16 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලය.

#### උපලේඛනය

| *අයදුම්කරුගේ නම* | *සමාජශාලාවේ ලේකම් සභාපති/කළමනාකරු* | *සමාජ ශාලාවේ නම* | *සමාජ ශාලාවේ කටයුතු කරගෙන යන ස්ථානය* |
|---|---|---|---|
| 1. කේ. ඩී. ස්ටෙම්බෝ | ලේකම් | බිලූමූන් ක්‍රීඩා සමාජය | අංක 241/C, ගාලු පාර, පඹුරණ, මාතර |

01-769

# විවිධ දැන්වීම්

## පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව

### 1952 වර්ෂයේ අංක 06 දරන පළාත් පාලන අධිකාරි (නියමිත උප විධිවිධාන) පනත

1952 වර්ෂයේ අංක 06 දරන පළාත් පාලන අධිකාරි (නියමිත උප විධිවිධාන) පනතේ (261 වන අධිකාරය) 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ 2018.10.11 දිනැති සභා සැසියේ තීරණ අංක 194 මඟින් සම්පූර්ණ කරනු ලබයි.

**1952 වර්ෂයේ අංක 06 දරන පළාත් පාලන අධිකාරි (නියමිත උප විධිවිධාන) පනත**

1952 වර්ෂයේ අංක 06 දරන පළාත් පාලන අධිකාරි (නියමිත උප විධිවිධාන) පනතේ (261 වන අධිකාරය) 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ 2018.10.11 දිනැති සභා සැසියේ තීරණ අංක 194 මඟින් සම්පූර්ණ කරනු ලබයි.

*යෝජනාව*

පළාත් පාලන හා ගෘහ නිර්මාණ ඇමති තුමා විසින් සකස් කරන ලද 1988 වර්ෂයේ අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* (iv (ආ) වැනි කොටස - පළාත් පාලන සභා වලට අදාලවයි යනුවෙන් ගරු උතුරු නැගෙනහිර පළාත් ආණ්ඩුකාරතුමා විසින් පිළිගනු ලැබූ 1994 වර්ෂයේ ඔක්තෝබර් මස 21 වැනි දිනැති අංක 842 දරන *ගැසට් පත්‍රයේ* (iv වැනි කොටස - (ආ) පළාත් සභා) පළ කරන ලද නියමිත උප විධිවිධාන වල 01 කොටසේත් නියමිත උප විධිවිධාන වල 11 කොටසේත් සඳහන් කර ඇති උප විධිවිධාන 01 සිට 42 දක්වා ඇත්තා වූ ද උතුරු පළාත් සභාව විසින් 2017.02.21 වැනි දින අනුමත කොට 2017.03.24 දිනැති අංක 2011 / 25 වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* 4 (අ) වැනි කොටසේ පළකරන ලද අධිකාරය 1 සිට 6 දක්වා ඇත්තා වූද, උතුරු පළාත් ප්‍රාදේශීය සභාවලට අදාළව නියමිත උප විධිවිධාන *ගැසට් පත්‍රයේ* පළකර ඇති නියමිත උප විධිවිධාන පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාබල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීම සඳහා 1952 වර්ෂයේ අංක 06 දරන පළාත් සභා (උප විධිවිධාන) පනතේ (261 වන අධිකාරය) 3 වන කොටසේ 1 වන උප වගන්තිය යටතේ පිළිගනු ලබන්නේ යයි පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ 2018.10.11 දිනැති සභා සැසියේ තීරණ අංක 194 මඟින් සම්පූර්ණ කරනු ලබයි.

සෙ. ප්‍රේමකාන්ත්,
සභාපති,
පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව.

පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව,
පුදුකුඩියිරුප්පු.

01 - 440/1

---

## පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව

### සත්ත්ව හිංසා නියෝග පනත (272 වන අධිකාරය) 17 (2) වන වගන්තිය යටතේ දැන්වීම - 2019

පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ පරිපාලන බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභාව විසින් පිළිගනු ලැබ ඇත්තා වූ ද, බදු පදනම යටතේ ලබා දී ඇත්තා වූ ද, කුමන හෝ මස් වෙළෙඳ සැලක් (සත්ත්ව හිංසා නියෝග පනත 272, 17 (1)) වගන්තිය යටතේ මා වෙත පවරනු ලබන ලද්දා වූ බලතලවලට අනුව පහත වගුවේ දක්වා ඇති පරිදි නියම කරනු ලැබ ඇති දිනවලදීත්, රජය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන දින වලදී ත්, මා විසින් වරින් වර දන්වා සිටිනු ලබන දිනවලදීත්, සතුන් විකිණීමෙනුත්, විකිණීම සඳහා එල්ලා තැබීමෙනුත්, මස් වෙළෙඳ සැල් විවෘත කර තැබීමෙනුත් මුළුමනින්ම වැළකී සිටියයුතු බව දන්වා සිටිනු ලැබේ.

සෙ. ප්‍රේමකාන්ත්,
සභාපති,
පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව.

පුදුකුඩියිරුප්පු,
පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

01. ශ්‍රී ලංකාවේ නිදහස් දිනය.
02. මහා ශිව රාත්‍රී දිනය.
03. වෙසක් පුර පසලොස්වක් දින (රජය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන දිනයන්).
04. ලෝක සත්ත්ව දිනය.
05. මාසික පුරපසලොස්වක් දින.
06. සභාව විසින් විශේෂයෙන් දැනුම් දෙනු ලබන දවස්.
07. මහ සිකුරාදා.

01-440/2

---

## පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව

### වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් ගාස්තු අය කිරීම - 2019

1987 වර්ෂයේ ප්‍රාදේශීය සභා පනතේ 126 7සී වගන්තිය යටතේ ලබා දී ඇති උපදෙස්වලට අනුව 1988.03.23 දිනැති අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ගරු පළාත් පාලන හා ගෘහ නිර්මාණ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් නිකුත් කරන ලද (62/A, 63/A , 64/A ) යන පිටුවල සඳහන් වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් සම්බන්ධව උපවිධිවිධාන වැඩපිළිවෙල යටතේ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභා- වේ පරිපාලන බල ප්‍රදේශය තුළ කුමන හෝ වෙනත් තාවකාලික ඉදිකිරීමක් වෙළෙඳ ප්‍රචාරක දැන්වීමක් හෝ වීදියෙන් පහතට එල්ලා වැටෙන සේ ප්‍රදර්ශනය කෙරෙන පුවරුවක් හෝ මතින් කුමන ආකාරයක හෝ සැරසිල්ලක් ස්ථාපනය කරන්නේ නම් හෝ ස්ථාපනය කෙරෙන සේ කටයුතු කරන්නේ නම් හෝ ඒ සඳහා පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවෙන් අනුමැතිය ලබා ගත යුතුය.

උක්ත කරුණ සම්බන්ධව පහත දක්වා ඇති වගුවට අනුව වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් ගාස්තුවක් අය කිරීමට තීරණය කර ඇති බව මෙයින් දන්වා සිටිනු ලැබේ. මෙසේ ප්‍රදර්ශනය කරවන ස්ථිර වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් සඳහා සෑම වර්ෂයක් පාසාම නියමිත ගාස්තුව ගෙවා යාවත්කාලීන කරගත යුතු බව ද දන්වා සිටිනු ලැබේ :

1. බිත්තියක් හෝ පුවරුවක් මත ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් සඳහා සෑම වර්ග අඩියක් සඳහා ම වර්ෂයකට (පුවරුවක දෙපැත්තේම ප්‍රදර්ශනය කිරීමේ දී දෙපැත්ත සඳහාම නියමිත ගාස්තුව ගෙවිය යුතු වේ. - රු. 75.00);
2. බැනරයක් මත ප්‍රදර්ශනය කරනු ලබන තාවකාලික වෙළෙඳ ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට - රු. 25.00;
3. පුවරුවක හෝ ආධාරකයක් සහිතව ප්‍රදර්ශනය කරනු ලබන විදුලි ආලෝකය සහිතව ප්‍රදර්ශනය කරනු ලබන වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් සඳහා වර්ග අඩියකට රු. 100.00;
4. ස්ථිර වෙළෙඳ ආයතන වල එකකට වැඩි වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් සහිත නාම පුවරු සඳහා වර්ග අඩියකට රු. 50.00;
5. ස්ථිර දැන්වීම් පුවරුවක පොදු ස්ථානවල ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට රු. 150.00 ;
6. බල ප්‍රදේශය තුළ වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු සඳහා ජංගම කුටියක් හෝ ජංගම වාහනයක් භාවිතා කිරීම සඳහා පැය 04ක කාල සීමාවක් සඳහා රු. 1,000.00 කුත්, වැඩිවන සෑම පැයකටම රු. 200.00

සෙ. ප්‍රේමකාන්ත්,
සභාපති,
පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව.

පුදුකුඩියිරුප්පු,
පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01 - 440/3

---

## පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව

### ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබා ගැනීම - 2019

පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ පරිපාලන බල ප්‍රදේශය තුළ කිසියම් ස්ථනයක් සඳහා 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 47 වැනි වගන්තියේ සිට 59 වැනි වගන්තිය දක්වා ගෘහ නිර්මාණ සංවර්ධන ආඥාපනතේ (600 වැනි අධිකාරය) ක්‍රියා පටිපාටීන් 1998. 01. 01 වැනි දින සිට අප ප්‍රාදේශීය සභාවට ගැලපෙන සේ ක්‍රියාත්මක වී ඇති ආකාරයන් පරිදි මා වෙත පැවරී ඇති බලතල හා මග පෙන්වීම් යටතේ 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ද සහිතව ප්‍රාදේශීය සභාවේ පරිපාලන බල ප්‍රදේශය තුළ නිවාස ඉදිකිරීමට බලාපොරොත්තු වන හෝ කුමන හෝ ඉදිකිරීමක් කිරීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් අයදුම්පතක් ඉදිරිපත්

කරනු ලබන එහි පරීක්ෂා කිරීමේ කටයුතු මත හා වෙනත් කාර්යයන් සඳහාත් පහත සඳහන් වගුව අනුව 2019.01.01 දින සිට ගාස්තුවක් අයකරනු ලබන බව පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ 2018.10.11 දිනැති සභා සැසියේ තීරණ අංක 194 මගින් සම්පූර්ණ කරනු ලබයි.

උපලේඛනය

| අංකය හා විස්තරය | 2019 වර්ෂය සඳහා අය කිරීම<br>*රු. ශත* |
|---|---|
| 01. පදිංචි ස්ථානයේ තාප්පයක් ඉදිකිරීමට (වර්ග අඩි 500ක් සඳහා)<br>වැඩිවන සෑම වර්ග අඩියකටම | 500.00<br>2.00 |
| 02. වාණිජ අරමුණින් තාප්පයක් ඉදිකිරීමට (වර්ග අඩි 500 ක් සඳහා)<br>වැඩිවන සෑම වර්ග අඩියකටම | 500.00<br>5.00 |
| 03. නේවාසික ගොඩනැගිලි සඳහා :<br>වර්ග අඩි 500 නොඉක්මවන එක් මහලකින් යුත් ගොඩනැගිලි සඳහා<br>වැඩිවන සෑම වර්ග අඩියකටම<br>මහල් දෙකක් සහිත ගොඩනැගිලි සඳහා සෑම වර්ග අඩියකටම<br>මහල් තුනක් සහිත ගොඩනැගිලි සඳහා සෑම වර්ග අඩියකටම | <br>500.00<br>2.00<br>3.00<br>5.00 |
| 04. ව්‍යාපාරික ගොඩනැගිලි සඳහා :<br>වර්ග අඩි 500 නොඉක්මවන එක් මහලකින් යුත් ගොඩනැගිලි සඳහා<br>වැඩිවන සෑම වර්ග අඩියකටම<br>මහල් දෙකක් සහිත ගොඩනැගිලි සඳහා සෑම වර්ග අඩියකටම<br>මහල් තුනක් සහිත ගොඩනැගිලි සඳහා සෑම වර්ග අඩියකටම | <br>1000.00<br>5.00<br>7.00<br>10.00 |
| 05. නේවාසික ගොඩනැගිලි ඉල්ලුම් පත්‍රය අනුමතවී නියමිත කාල සීමාව තුල සම්පූර්ණ කිරීමට නොහැකිවීම හේතුවෙන් නැවත අළුත්වැඩියා කිරීමේ ගාස්තුව | 500.00 |
| 06. ව්‍යාපාරික ගොඩනැගිලි ඉල්ලුම් පත්‍රය අනුමත වී නියමිත කාල සීමාව තුල සම්පූර්ණ කිරීමට නොහැකි වීම හේතුවෙන් නැවත අළුත්වැඩියා කිරීමේ ගාස්තුව - එක් වර්ෂයක් සඳහා | 1000.00 |
| 07. නේවාසික ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් ඉදිකළ පසු පදිංචිවීමේ සහතිකය ඉල්ලීමේ ගාස්තුව | 1000.00 |
| 08. ව්‍යාපාරික ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් ඉදිකල පසු පදිංචිවීමේ සහතිකය ඉල්ලීමේ ගාස්තුව | 1000.00 |
| 09. ගොඩනැගිලි ඉල්ලුම්පත් ආකෘති පත්‍ර ගාස්තුව<br>නේවාසික ගොඩනැගිලි / නිවාස මායිම් තාප්ප සඳහා<br>ව්‍යාපාරික ගොඩනැගිලි සඳහා | <br>200.00<br>500.00 |

සෙ. ප්‍රේමකාන්ත්,
සභාපති,
පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව.

පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව,
පුදුකුඩියිරුප්පු.

01 - 440/4

## පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (272 වන අධිකාරය) - 2019

පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ පරිපාලන බල ප්‍රදේශය තුල ඇති කරනු ලබන සෑම සුනඛයෙකුම, සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥා පනත (477 වන අධිකාරය) 4 වෙනි වගන්තිය ප්‍රකාරව 2019 වර්ෂය සඳහා ලියා පදිංචි කිරීමේ ගාස්තුව සහ එම සත්ත්වයින් පිරිමි සුනඛයින් හෝ ගැහැණු හෝ සුනඛයින් කුමන සතෙකු වුව ද, එක් එක් සතෙකු සඳහා රු. 50.00 ක බද්දක් පනවනු ලබනු ඇත. මෙම ගාස්තුව ගෙවිය යුතු බව පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ 2018.10.11 දිනැති සභා සැසියේ තීරණ අංක 194 මගින් සම්පූර්ණ කරනු ලබයි.

සෙ. ප්‍රේමකාන්ත්,
සභාපති,
පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව.

පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව,
පුදුකුඩියිරුප්පු.

01 - 440/5

---

## පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව

### ජාතික පාරිසරික පනත යටතේ දැන්වීම - 2019

1980 අංක 47 දරන ජාතික පාරිසරක අධිකාරිය 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ ද 1988 අංක 56 දරන සංශෝධිත පනත යටතේ ඇති විධිවිධානවලට අනුව මධ්‍යම පරිසර සභාපති විසින් ඉහත සඳහන් පනතේ 26 වැනි වගන්තිය යටතේ මා වෙත පවරන ලද බලතල ප්‍රකාරව 2001 වසරේ සැප්තැම්බර් මස 01 වැනි දින සිට පහත වගුවේ දක්වා ඇති නිර්ණයන් වගකීම් හා සේවාවනුත් ප්‍රාදේශීය සභා සභාපතිතුමාට පවරන ලද බලතල යටතේ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ පරිපාලන බල ප්‍රදේශය තුල ක්‍රියාවට නංවා ඇති අතර පහත වගුවේ සඳහන් හස්ත කර්මාන්ත මත පරිසර අධිකාරිය විසින් සඳහන් කර ඇති පරිදි ආකෘති පත්‍ර ගාස්තු, පරීක්ෂණ ගාස්තු අනුමැතිය සඳහා වන ගාස්තු යනාදිය පනවා අයකර ගනු ලබන බවත් මෙයින් තීරණය කොට ප්‍රකාශ කරමි. මෙම ප්‍රකාශය මත පනවනු ලබන ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ පනවා අය කරනු ලබන හිමිකම් ගාස්තු හැර හා ඊට අතිරේකව ඒවා ඒ ආකාරයෙන් ම බල නොපානු ඇත.

#### උපලේඛනය

01. 05 දෙනෙකු නොවැඩි සේවකයින් සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති සබන්, කුණු ඉවත් කිරීම සිදු කරන ද්‍රව්‍ය හෝ වෙනත් කුමන හෝ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය නිෂ්පාදනය කරන කර්මාන්ත
02. 05 දෙනෙකුට අඩු කම්කරුවන් සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති දේශීය ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීම, විශ්ලේෂණය කිරීම හා ඇසුරුම් කිරීමේ කර්මාන්ත
03. ඊයම් උණු කිරීම මගින් අකුරු සාදනු නොලබන මුද්‍රණාල
04. 05 දෙනෙකුට අඩු කම්කරුවන් සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති බැටරික් කර්මාන්ත
05. 05 දෙනෙකුට අඩු කම්කරුවන් සංඛ්‍යාවක් සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති ෆයිබර් ග්ලාස් ආශ්‍රිත කර්මාන්ත
06. 05 දෙනෙකුට අඩු කම්කරුවන් සංඛ්‍යාවක් සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති සේදුම් කුඩු භාවිතා කර වියළි සේදුම් කටයුතු සිදුකිරීමේ ව්‍යාපාරය.
07. ස්වාභාවිකව අපද්‍රව්‍ය කොටස් ඉවත්කරන හෝ සායම් කිරීම සිදු නොකරන පොල් කොහු මෝල්
08. 05 කට අඩු යන්ත්‍ර සංඛ්‍යාවක් සහිත රෙදි විවීම් මධ්‍යස්ථාන
09. 05 කට වැඩි අත් යන්ත්‍ර සංඛ්‍යාවක් ඇති අත් යන්ත්‍ර රෙදි විවීම් මධ්‍යස්ථාන
10. 05 දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති එළවළු, පලතුරු, මස්, මුහුදු ආහාර හෝ කිරි සකස් කිරීමේ කර්මාන්ත
11. 05 දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති පොල්තෙල් සිඳීමේ කර්මාන්ත
12. 05 දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති බේකරි නිෂ්පාදන, බිස්කට් වර්ග, රසකැවිලි නිෂ්පාදන කර්මාන්ත
13. 05 දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා මත්පැන් හැර වෙනත් පාන වර්ග නිෂ්පාදන කර්මාන්ත
14. දිනකට කිලෝ ග්‍රෑම් 500 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත තෙතමනය ඇති කිරීම මගින් වී කෙටීම සිදුකරන සහල් මෝල්
15. වියළීම මගින් වී කෙටීම සිදුකරන සහල් මෝල් (පෙඟවීම සිදු නොකරන)
16. ඇඹරුම් හල්

17. 50 කට අඩු පක්ෂීන් සංඛ්‍යාවක් සහිත කුකුළු ගොවිපලවල්
18. 5 කට අඩු සතුන් සංඛ්‍යාවක් සහිත ඌරු ගොවිපලවල්
19. 5 කට අඩු සතුන් සංඛ්‍යාවක් සහිත එළු හෝ ගව පට්ටි
20. දිනකට මෙට්‍රික් ටොන් 25 කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත සත්ත්ව ආහාර නිෂ්පාදන කර්මාන්ත
21. දිනකට ඝන මීටර් 50 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත කොන්ක්‍රීට් කර්මාන්ත
22. කොන්ක්‍රීට් අච්චු සෑදීමේ කර්මාන්ත
23. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරවන සිමෙන්ති කුට්ටි නිෂ්පාදන කර්මාන්ත ශාලා
24. මෙට්‍රික් ටොන් 20 ට අඩු නිෂ්පාදන ධාරිතාවයකින් යුත් හුණු පෝරණු
25. 05 දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා ක්‍රියාත්මක කරවන මැටි ආශ්‍රිත කර්මාන්ත
26. උළු හෝ ගඩොල් පෝරණු
27. අතින් ක්‍රියාත්මක කරන උපකරණ භාවිතා කරමින් ගල් තැලීම් කටයුතු සිදු නොකරන දිනකට ඝන මීටර් 25 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත කළුගල් තැලීමේ හෝ පදම් කිරීමේ කර්මාන්ත
28. එක් දිනකට මෙට්‍රික් ටොන් 5 කට අඩු යෙදවුම් ධාරිතාවක් සහිත දහන ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත
29. පෝරණු භාවිතයෙන් හෝ ඖෂධ වර්ග කල් තබා ගැනීම් සිදුකරන කර්මාන්ත
30. දිනකට ඝන මීටර් 50කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත ලී ඉරුම් මෝල්
31. අශ්ව බල 3කට වැඩි වූ මෝටර් භාවිතා කරන වඩු කර්මාන්ත ස්ථාන
32. 05 දෙනෙකුට වැඩි සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවා කටයුතු කරන ආහාර පිසීමේ කටයුතු කරන නවාතැන් පහසුකම් රහිත සංචාරක නවාතැන් පොළවල්
33. 05 දෙනෙකුට වැඩිවූද 20 කට අඩුවූද සංචාරකයන් සංඛ්‍යාවකට ආහාර සහ නවාතැන් පහසුකම් සැපයිය හැකි ස්ථාන.
34. සේවා මුර පදනම යටතේ එක් සේවා මුරයකට 05 දෙනෙකුට අඩු සේවක සංඛ්‍යාවක් යොදවා ඇති නිමි ඇඳුම් කර්මාන්ත
35. 05 දෙනෙකුට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවා කටයුතු කරන වෑද්දුම් පට්ටල හෝ පෑස්සුම් (වෙල්ඩින්) වැඩපලවල් ඇතුලුව යාන්ත්‍රික කර්මාන්ත ශාලා, යාන්ත්‍රික උපකරණ නිෂ්පාදනය හෝ පෑස්සුම් කර්මාන්ත
36. දෝෂ හඳුනාගැනීම හෝ නඩත්තු කිරීම සහ ද්‍රව වායු මධ්‍යස්ථාන පවත්වාගෙන යාම වැනි කටයුතු පහසුකම් සලසන වාහන අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීමේ කටයුතු සිදුකරන වාහන අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථාන
37. පිරිසිදු කිරීමේ මධ්‍යස්ථාන (සී ශ්‍රේණිය)
38. 05 දෙනෙක් හෝ 05 දෙනෙකුට වැඩි සේවකයින් සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථාන

සෙ. ප්‍රේමකාන්ත්,
සභාපති,
පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව.

පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව,
පුදුකුඩියිරුප්පු.

01 - 440/6

---

**පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව**

බලපත්‍ර ලබාදීමේ ගාස්තු - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147, 148, 149, 150 (1), (2), 151, 152 (1), (2), 153 (1), 154 (1), වැනි වගන්ති යටතේ 2018 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට 2018 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින දක්වා පහත වගුවේ සඳහන් පරිදි බලපත්‍ර ගාස්තු, කර්මාන්ත මත බදු අයකරනු ලබන බවත් සෑම බලපත්‍ර ගාස්තුවක්ම වගුවේ සඳහන් ආකාරයට 2019.03.31 දිනට පෙර ගෙවිය යුතු බවත් පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවේ 2018.10.11 දිනැති සභා සැසියේ තීරණ අංක 194 මගින් සම්පූර්ණ කරනු ලබයි.

සෙ. ප්‍රේමකාන්ත්,
සභාපති,
පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව.

පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව,
පුදුකුඩියිරුප්පු.

**පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව**

ව්‍යාපාර බලපත්‍ර ලබාදීමේ ගාස්තු - 2019

*උපලේඛනය*

| *අනු. අංකය* | *තීරුව - I* *ව්‍යාපාරයේ ස්වභාවය* | *තීරුව - II* *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 ට පහළ* | *රු. 750 සිට රු. 1500 දක්වා* | *රු. 1500ට ඉහළ* |
| 01 | නවාතැන් පලක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 02 | හෝටලයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 03 | තේ කඩයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 04 | බේකරියක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 05 | මස්වර්ග වෙළඳ සැලක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 06 | අයිස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 07 | සිසිල් පැන් කම්හලක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 08 | රෙදි සෝදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 09 | භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 10 | කොණ්ඩා සැරසීම හා කොණ්ඩා සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 11 | මනාලියන් හැඩගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 12 | ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 13 | බටහිර ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 14 | පරිගණක අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 15 | වාප්පු වැඩ බිමක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 16 | වෙල්ඩින් වැඩ පලක් හෝ ග්‍රිල් වැඩ පලක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 17 | යකඩ වැඩ පලක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 18 | යාන්ත්‍රික වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 19 | කොන්ක්‍රීට් සිලින්ඩර් හා සිමෙන්ති ගල් හෝ වෙනත් සිමෙන්ති නිෂ්පාදන කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 20 | මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 21 | ත්‍රිරෝද රථ හා යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 22 | වායු පිරවුම් යන්ත්‍ර, ශිතකරණ යන්ත්‍ර, අධි ශීතකරණ යන්ත්‍ර හා විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 23 | පොහොර වර්ග හා කෘෂි රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 24 | සත්ත්ව ආහාර වර්ග ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 25 | ගල් කැඩීම හා අතින් ගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 26 | වාහන, පාපැදි හා මෝටර් වාහන සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 27 | විදුලිබලයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |

| අනු. අංකය | තීරුව - I<br>ව්‍යාපාරයේ ස්වභාවය | තීරුව - II<br>ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු. 750 ට පහළ | රු. 750 සිට රු. 1500 දක්වා | රු. 1500ට ඉහළ |
| 28 | හුණු පොරණුවක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 29 | ලී මෝලක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 30 | පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 31 | එළවළු හා පළතුරු වර්ග අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 32 | දන්ත චිකිත්සාගාරයක් හෝ දත් බඳින මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 33 | පපඩම් හෝ නූඩ්ලස් නිෂ්පාදනය කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්-වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 34 | බිත්තර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 35 | රසකැවිලි නිෂ්පාදනය කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 36 | අයිස්ක්‍රීම්, යෝගට් හා බීම පැකට් නිෂ්පාදනය කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 37 | කරවල, ජාඩිවේලීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 38 | ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 39 | කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 40 | 15ට වැඩි එළු පට්ටියක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 41 | ඇඹරුම් හලක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 42 | පොල්කෙඳි හා ලී වැඩ කරන ව්‍යාපාර මෝලක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 43 | රෙදි වර්ණවත් කිරීමේ (බතික්) ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 44 | ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 45 | මෙට්ට (ගුදිරි) නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 46 | සබන් නිෂ්පාදන කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 47 | අවමංගල සේවා සපයන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 48 | රිදී, රත්තරන් වැනි දෑ අමු ද්‍රව්‍ය ලෙස ගෙන ස්වර්ණාභරන නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 49 | ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 50 | රියදුරු පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 51 | මණි බඩු හා විසිතුරු භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 52 | යතුරුපැදි හා ත්‍රීවීල් අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 53 | මැෂින් අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 54 | අත්කම් භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 55 | කැටයම් ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 56 | බුලත්, පුවක්, කොසු, ඉදල් හා මැටි භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්-වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 57 | උත්සව කාල සිනමා ශාලාවක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |

| අනු. අංකය | තීරුව - I<br>ව්‍යාපාරයේ ස්වභාවය | තීරුව - II<br>ස්ථානයේ වාර්ෂික වටිනාකම<br>රු. 750 ට පහළ | රු. 750 සිට රු. 1500 දක්වා | රු. 1500ට ඉහළ |
|---|---|---|---|---|
| 58 | ප්ලාස්ටික් භාණ්ඩ, පොලිතීන් ද්‍රව්‍ය ගබඩා කිරීම හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 59 | ජ්‍යොතිෂ කාර්යාලයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 60 | උත්සව භාණ්ඩ කුලියට දීම හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 61 | රෙදි විකිණීමේ ස්ථානයක් (රෙදි කඩයක්) පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 62 | නිමි ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 63 | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 64 | මනාලියන් හැඩගැන්වීමේ උපකරණ කුලියට ලබා දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 65 | ලිපි ද්‍රව්‍ය, සඟරා හා පාසැල් උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 66 | පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 67 | දේශීය, විදේශීය දුරකතන සම්බන්ධතා ලබා දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 68 | සංයුක්ත තැටි, වීඩියෝ පට, ටෙලි නාට්‍ය හා ගීත පටිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 69 | ඡායාරූප ශාලාවක් (ස්ටුඩියෝ) පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 70 | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 71 | පූජා භාණ්ඩ ගබඩාකිරීම හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 72 | කුෂන් වැඩ පලක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 73 | මිනුම් කිරුම් උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 74 | සංගීත භාණ්ඩ කුලියට දීම හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 75 | ක්ෂණික ඡායාරූප කිරීම, රෝනියෝ කිරීම සහ ලැමිනේට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 76 | විදේශීය චෙක්පත් (මුදල්) හුවමාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 77 | පරිගණක යන්ත්‍ර විකිණීමේ හෝ පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 78 | ශීතකරණ යන්ත්‍ර, අධිශීතකරණ යන්ත්‍ර, වායු පිරවීමේ යන්ත්‍ර අලෙවි කිරීම හා පාඨමාලා පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 79 | පුවත්පත් දැන්වීම් පළ කිරීමේ නියෝජිත ස්ථානයක් හෝ පුවත්පත් අලෙවිකිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 80 | බෝට්ටු හෝ ඔරු සේවයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 81 | ජුකී මැෂින් පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 82 | සෙලියුලර් දුරකථන හා දුරකථන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |

| අනු. අංකය | තීරුව - I | තීරුව - II | | |
|---|---|---|---|---|
| | | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| | ව්‍යාපාරයේ ස්වභාවය | රු. 750 ට පහළ | රු. 750 සිට රු. 1500 දක්වා | රු. 1500ට ඉහළ |
| 83 | කිමිදුම් උපකරණ කුලියට දීම, හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 84 | පිඟන් භාණ්ඩ හා සෙරමික් භාණ්ඩ (පෝසිලේන් සිල්වර් භාණ්ඩ ඇතුලු) ගබඩා කිරීම හෝ අලෙවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 85 | ක්‍රීඩා උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 86 | ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 87 | දැන්වීම් පුවරු ඇඳීම් හා ප්ලාස්ටික් අංක සකස්කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 88 | මල්පැල, ඖෂධ පැල වර්ග හා වෙනත් පැල වර්ග විකිණීම, තවාන් කිරීම හා ප්‍රදර්ශනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 89 | හෙදි පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 90 | ඇලුමිනියම් භාණ්ඩ අලෙවි කිරීම හා ගබඩා කිරීම හා ගබඩා කිරීමේ ස්ථා-නයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 91 | උත්සව අවස්ථා සඳහා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 92 | අන්තර්ජාල පහසුකම් සහිත ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 93 | ලී කැටයම් හා වෙස් මුහුණු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 94 | විදුලි ජනන යන්ත්‍ර (ජෙනරේටර්) කුලියට ලබා දීමේ මධ්‍යස්ථානයක් පවත්-වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 95 | මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 96 | පුද්ගලික අධ්‍යාපන ආයතනයක් (පංති) පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 97 | පරණ යකඩ, ප්ලාස්ටික් බෝතල්, හිස් බෝතල්, පුවත්පත් හා බෑග් ගබඩා කිරීම හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 98 | සුරතල් සතුන් (මසුන්) ඇතිකිරීම, අලෙවි කිරීම හා මාළු ටැංකි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 99 | තැඹිලි, කුරුම්බා, පොල්, කෙසෙල් කැන් හා පලා වර්ග අලෙවි කිරීමේ ස්ථා-නයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 100 | තාවකාලික ව්‍යාපාර ප්‍රවර්ධන වැඩසටහන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 101 | ලී බඩු හා වෙනත් ඕනෑම ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 102 | ලී බඩු අලෙවි කිරීමේ පොළක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
| 103 | දර මඩුවක් පවත්වාගෙන යාම | 500.0 | 750.00 | 1000.00 |
01. සීමා තාප්ප - අත්තිවාරම් ඉදිකිරීම්(එක් දිග අඩියක් සඳහා) 4.00
02. සීමා තාප්ප - සම්පූර්ණ ඉදිකිරීම්(එක් දිග අඩියක් සඳහා) 8.00

උපලේඛන -5

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 49(අ) පරිච්ඡේදය අනුව ප්‍රාදේශීය සභා පාරේ මැද සිට අඩි25ක සීමාවතුළ යම් ගොඩනැගිල්ලක්, සීමා බැම් හෝ දොරටුවක් ප්‍රාදේශීය සභාවේ අනුමැතියකින් තොරව ඉදිකිරීම තහනම්. කයිට්ස් ප්‍රාදේශීය සභාවේ මාර්ගයක පළල අඩි 22ක් වන ලෙස සීමා කරන අතර (මාර්ගයේ මධ්‍යයේ සිට අඩි 22ක්) මාර්ගය පුළුල් කිරීමේ දී වන්දි කිසිවක් ගෙවීමේ අවශ්‍යතාවයක් නොවන බව නිවාස හිමිකරුවන් ලිඛිතව පොරොන්දුවන අවස්ථාවේදී පහත සඳහන් පරිදි දේපළ ප්‍රමාණයන් අනුව ඉදිකිරීම් ඉල්ලීම් පරීක්ෂා කරනු ලැබේ.

දේපළ ප්‍රමාණය (උපරිම) වීථියේ අවම පළල.

0-4 අඩි 10 (වීථියේ මැද සිට අඩි 5)

5-8 අඩි 15 (වීථියේ මැද සිට අඩි 7.5)

9-20 අඩි 20 (වීථියේ මැද සිට අඩි 10)

සැලකිය යුතුයි .- සීමා මායිම් ඉදිකිරීම් පිළිබඳ අයදුම්පත්‍ර සලකා බැලීමේ දී ප්‍රාදේශීය සභාවේ දේපළ සංඛ්‍යාව අනුව සීමා මායිම් පිහිටිය යුතු සීමා මායිමට වඩා මේ වන විට ඉදිකරන ලද සීමා මායිම අධික මායිමක පිහිටියේ නම් එය සැලකිල්ලට ගනු ලැබේ.

ඉදි කිරීම් විථියේ මැද සිට අඩි 15 කට ඔබ්බෙන් පිහිටා තිබීම ගොඩනැගිලි අයදුම්පත පරීක්ෂා කිරීමේදී සැලකිල්ලට ගනු ලැබේ.

ම. ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/7

---

**කයිට්ස් ප්‍රාදේශීය සභාව**

වෙළෙඳ දැන්වීම් ගාස්තුව

1987 ප්‍රාදේශීය සභා පනතේ 126-7C පරිච්ඡේදය යටතේ ලබාදී ඇති බලය ප්‍රකාරව 02.02.2016 දිනැති අංක 1952/16 දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* උතුරු පළාත් පළාත් පාලන අමාත්‍ය විසින් නිකුත් කරනලද.(91/A, 92/A, 93/A, 94/A, 95/A, 96/A, 97/A, 98/A, 99/A) පිටුවල 07.07.2017 වැනි දින අංක 2027 දරන *ගැසට් පත්‍රය* මගින් මා විසින් පිළිගන්නා ලද වෙළෙඳ දැන්වී සම්බන්ධයෙන්, උප වගන්තියේ විධිවිධාන අනුව කයිට්ස් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් හෝ කෙනෙක් යම් මාර්ගයක හෝ පාරට නෙරා තිබෙන සේ වෙළෙඳ දැන්වීම් හෝ මාර්ගයට දර්ශනය වනසේ ප්‍රදර්ශනය කරන ලද දැන්වීම් පුවරුවට හා වෙනත් තාවකාලික ව්‍යූහයන්හි හෝ කුමන හෝ ආකාරයක අලංකාර කිරීම හෝ එසේ කිරීමට සංවිධානය කිරීම යන කාර්යයන් සඳහා කයිට්ස් ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගත යුතුයි. මෙම කරුණු සම්බන්ධව පහත දක්වා ඇති උප ලේඛනය අනුව වෙළෙඳ දැන්වීම ගාස්තු අයකර ගැනීමට තීරණය කර ඇති බව මෙයින් ප්‍රසිද්ධ කරමි. මෙසේ ඉදිකරන ස්ථිර වෙළෙඳ දැන්වීම වසරක් පාසා නියමිත ගාස්තු ගෙවා අනුමැතිය අළුත් කරවා ගත යුතු බවද 15.11.2018 වැනි දින අංක 15 දරන තීරණය අනුව තීරණය කර ඇති බව ද දන්වනු ලැබේ.

| | | රු. ශත |
|---|---|---|
| 01. | බිත්තියක හෝ නාම පුවරුවක ප්‍රදර්ශනය කර ඇති ස්ථිර වෙළෙඳ දැන්වීම් සෑම වර්ග අඩියක් වසරක් සඳහා හෝ එක් කොටසකට (නාමපුවරුවක පැති දෙකේම දැන්වීම් ප්‍රදර්ශනය කර ඇත්නම් පැති දෙකටම ගාස්තු අයකර ගත යුතුයි)- | 100.00 |
| 02. | බැනර් එකක් මගින් ප්‍රදර්ශනය කර ඇති තාවකාලික දැන්වීම සෑම වර්ග අඩියකටම මාසයක් සඳහා හෝ එක් කොටසකට | 25.00 |

| | | |
|---|---|---|
| 03. | එක් පුවරුවක හෝ ආධාරක සහිතව ප්‍රදර්ශන සඳහා විදුළි ආලෝක කරන ලද දැන්වීමටද සෑම වර්ග අඩියක් වසරක් සඳහා හෝ එක් කොටසකට - | 50.00 |
| 04. | ස්ථිර වෙළෙඳ ආයතනවල දැන්වීමත් සමග නාම පුවරුවට වර්ග අඩියකට - | 100.00 |

ම.ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/8

---

## කයිට්ස් ප්‍රාදේශීය සභාව

### අයාලේ යන ගවයින් හා සතුන් පාලනය කිරීම

1987 ප්‍රාදේශීය සභා අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධානවලට යටත්ව කයිට්ස් ප්‍රදේශ සීමාව තුළ යම් මංමාවතක හෝ ඒ අවට දිගේලිකර හෝ වීදියේ අයාලේ යන ගවයින් හා එළුවන් ආදි සතුන්ගෙන් ප්‍රදේශයේ ජනතාවට සහ දේපළවලට විශාල වශයෙන් හානි පැමිණෙන බැවින් එම ආපදාවන් වැළක්වීම සඳහා කටයුතු කිරීම පිණිස මෙම දැන්වීම *ගැසට් පත්‍රය* පලකරනු ලබන දින සිට ගාස්තු නියම කළ යුතු බව 15.11.2018 වැනි දින හා අංක 16 දරණ තීරණය අනුව තීරණය කර ඇති බව ද දන්වනු ලැබේ.

| | |
|---|---|
| ගවයින් ඇල්ලීමේ ගාස්තුව (එක සතෙකුට) | - රු 1000.00 |
| ගවයින් සඳහා දඩ මුදල් (එක සතෙකුට) | - රු 500.00 |
| ගවයින් ආරක්ෂා කිරීමේ ගාස්තුව - එක් දිනයකට (එක සතෙකුට) | - රු 200.00 |
| ගවයින් නඩත්තු කිරීමේ ගාස්තුව-එක් දිනයකට ( එක සතෙකුට) | - රු 250.00 |
| එළුවන් ඇල්ලීමේ ගාස්තුව- (එක සතෙකුට) | - රු 500.00 |
| එළුවන් සඳහා දඩ මුදල් (එක සතෙකුට) | -රු 250.00 |
| එළුවන් ආරක්ෂා කිරීමේ ගාස්තුව - එක් දිනයකට (එක සතෙකුට) | - රු 100.00 |
| එළුවන් නඩත්තුකිරීමේ ගාස්තුව - එක් දිනයකට ( එක සතෙකුට) | - රු 150.00 |

ම.ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/9

## කයිට්ස් ප්‍රාදේශීය සභාව

සංචාරක වෙළදාම් කරන (ස්ථිර ස්ථානයක් නොමැති) වෙළෙඳුන් සඳහා බදු පැනවීම

1987අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ලබා දී ඇති බලතල අනුව 1998.08.23 වැනි දින අංක 520/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටස පළාත් පාලන් කොටසේ අමාත්‍ය තුමා විසින් පලකරන ලද උප විධිවිධාන යටතේ 28 වැනි වගන්තිය යටතේ කයිට්ස් ප්‍රාදේශීය සභා සීමාව තුළ සංචාරක වෙළෙදාම් කරන වෙළෙඳුන්ට පහත දක්වා ඇති වගුව අනුව 2019.01.01 දින සිට අයකර ගැනීම් පැනවිය යුතු බව 2018.11.15 වැනි දින අංක 17 දරන සභා සම්මුතියේ තීරණය කර ඇති බව ද දන්වනු ලැබේ.

### උපලේඛනය

| | | රු.ශ |
|---|---|---|
| 1. | පාපැදියක අයිස් ක්‍රීම්, අයිස් පලම් විකිණීම (1 දිනකට) | 50.00 |
| 2. | යතුරු පැදියක අයිස් ක්‍රීම්, අයිස් පලම් විකිණීමත (1 දිනකට) | 100.00 |
| 3. | ත්‍රිවීලරයේ අයිස් ක්‍රීම්, අයිස් පලම් විකිණීමත (1 දිනකට) | 100.00 |
| 4. | මොටර් රථයේ අයිස් ක්‍රීම්, අයිස් පලම් විකිණීමත (1 දිනකට) | 200.00 |
| 5. | සකස් කරන ලද කෑම වර්ග ජංගම රථයක, පාපැදියක විකිණීම. | 50.00 |

ම. ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/10

---

## කයිට්ස් ප්‍රාදේශීය සභාව

සභාවේ ජල ගාස්තුව, ජල ටැන්කි කුලියට දීමේ ගාස්තු

2019.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජල ටැන්කි කුලියට දීම, ජල සැපසීම සඳහා පනවන පහත සඳහන් ගාස්තු අය කළ යුතුයි. යනුවෙන් 2018.11.15 වැනි දින හා අංක 18 දරන තීරණය අනුව මගින් තීරණය කරන ලද බව මෙයින් දන්වනු ලැබේ.

| | |
|---|---|
| ලීටර් 1000 ක ජල සැපයීම සඳහා ගාස්තු | රු.600 00 |
| ජල ටැන්කිය රඳවනය සමග (දිනකට) | රු.400 00 |

ම. ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/11

**කයිට්ස් ප්‍රාදේශීය සභාව**

බෙදුම් කරන ලද ඉඩම් සැලසුම් අනුමත කිරීම

කයිට්ස් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති ඉඩම් කොටස් කිරීමේ දී එහි අනු කොටස්වල සැලසුම් අනුමත කිරීමට ඉඩම් ඔප්පුව හා එහි සැලසුම් පෙන්නුම් කරන ඉඩමේ ප්‍රමාණය අනුව එක් ඉඩමකට රු 100ක ගාස්තුවක් මෙම දැන්වීම් *ගැසට් පත්‍රයේ* පළ කරන දින සිට අය කර ගන්නා බව 2018.11.15 වැනි දින හා අංක 19 දරන තීරණය මගින් තීරණය කරන ලද බව මෙයින් දන්වනු ලැබේ.

ම.ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/12

---

**කයිට්ස් ප්‍රාදේශීය සභාව**

ගල්, වැලි, බොරළු පටවන වාහන සඳහා ගාස්තු අයකිරීම්

2019.01.01 දින සිට ක්‍රියාත්මකවන පරිදි ගල්, වැලි, බොරළු පටවන වාහන සඳහා ගාස්තු පහත සඳහන් පරිදි අයකරන බව 15.11.2018 වැනි දින හා අංක 20 දරන තීරණය මගින් තීරණය කරන ලද බව මෙයින් දන්වනු ලැබේ.

**උපලේඛණය**

| | | |
|---|---|---|
| 1. | බොරළු (3-4 කියුබ්) එකකට | - රු. 150 00 |
| 2. | වැලි (3-4 කියුබ්) එකකට | - රු. 150 00 |
| 3. | ගල් (3-4 කියුබ්) එකකට | - රු. 150 00 |
| 4. | කුඩා ගල්(3-4 කියුබ්) එකකට | - රු. 150 00 |

ම.ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/13

---

**කයිට්ස් ප්‍රාදේශීය සභාව**

ගෝඝාතක ආඥාපනත (272 අධිකාරය)17(2) වගන්තිය ප්‍රකාර නිවේදනයයි

කයිට්ස් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාවන් ඇතුළත, ප්‍රාදේශීය සභාව විසින් බදුදෙන ලද කිසිදු මස් කඩයක් ගෝඝාතක ආඥා පනත (272 අධිකාරය) 17 (2) වැනි වගන්තියෙන් සභාව වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාරව නිසි බලධාරියාවූ ද කයිට්ස් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වූ ද මෙම පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දිනවල දී, රජය විසින් ප්‍රකාශිත විශේෂ දිනයන්හි දී ද, මා විසින් ප්‍රකාශයට පත්කරනු ලබන දිනයන් ද, මස් පිණිස සතුන් මැරීම, හෝ මස්, විකිණීම හෝ විකිණීම පිණිස මස් ප්‍රදර්ශනයට තැබීම හෝ මස් කඩ විවෘත කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම් කරන බව 15.11.2018 වැනි දින හා අංක 21 දරන තීරණය මගින් තීරණය කරන ලද බව මෙයින් දන්වනු ලැබේ

**උපලේඛනය**

01) ජාතික නිදහස් දිනය.

02) මහා සිවරාත්‍රි දිනය.

03) වෙසක් පොහොය දිනය (රජය විසින් ප්‍රකාශයට පත්කරනු ලබන දිනයන්).

04) ලෝක සත්ව දිනය.

05) මාසික පොහොය දිනයන්.

ම.ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/14

---

## කයිට්ස් ප්‍රාදේශීය සභාව

### කුලී රථ සඳහා වූ අයකිරීම්

2019.01.01 දින සිට ක්‍රියාත්මකවන පරිදි සභාවට අයත් පහත සඳහන් වර්ගයේ වාහන කුලියට ලබා දීමේදී පහත සඳහන් ගාස්තු පනවා අය කර ගන්නා බව 15.11.2018 වැනි දින හා අංක 22 දරන තීරණය මගින් තීරණය කරන ලද බව මෙයින් දන්වනු ලැබේ.

| | | |
|---|---|---|
| 1. | ජේ.සිබී වාහනයේ පැයකට අය කරන ගාස්තුව | - රු 3,000.00 |
| 2. | මාර්ග තලන යන්ත්‍ර<br>(රෝලරය) - (පළමු පැයේ සිට පැය හතරකට අයකරන ගාස්තු)-<br>එතැන් සිට සෑම පැයකට | රු 8,000.00 |
| | | - රු 1,800.00 |
| 3. | ට්‍රැක්ටර් පැයකට අයකරන ගාස්තුව (ටේලරය සමග) | |
| | | - රු 500.00 |
| 4. | අත් ට්‍රැක්ටර් පැයකට (ටේලරය සමග) | |
| | | - රු 250.00 |
| 5. | කැන්ටර් වාහනය පළමු කි. මී. එකේ සිට 10කට | |
| | | - රු 1,000.00 |
| 6. | අතිරේක සෑම කි.මී සඳහා | |
| | | - රු 80.00 |

ම.ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/15

**කයිට්ස් ප්‍රාදේශීය සභාව**

ස්ථානයන් සීමා කිරීම

1987 ප්‍රාදේශීය සභා පනත යටතේ පවරා ඇති බලතල අනුව 2016.02.02 වැනි දිනැති හා අංක 1952/16 දරණ *අති විශෙෂ ගැසට් පත්‍රය* උතුරු පළාත් පළාත් පාලන කටයුතු භාර අමාත්‍යතුමා විසින් ප්‍රසිද්ධ කරන ලද 2017.07.07 දිනැති හා අංක 2027දරණ ගැසට් පත මගින් කයිට්ස් ප්‍රාදේශීය සභාව පිළිගන්නා ලද පොදු වෙළෙඳ පොළ සම්බන්ධ දැන්වීම් ගැන කයිට්ස් ප්‍රාදේශීය සභාවට සුදුසු බල ප්‍රදේශය තුල එළවළු හා මාළු වෙළෙඳපොළ බඳුදීමේ පදනම මත ලබා දීමෙන් වෙළෙඳ පොළේ සිට කි.මී 1/2ක් වපරිසරය තුළ එළවළු, මාළු, කුකුල් සහ මුහුදු මත්‍යස වෙළඳාම් කිරීම තහනම් කරන බව 2018.11.15 වැනි දින අංක 23 දරණ තීරණය මගින් තීරණය කරනලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. කයිට්ස් එළවළු පොළ සහ ගොවි වෙළෙඳ පොළ(පාපැදි ආරක්ෂා ගාල ඇතුළුව)
2. කයිට්ස් මාළු වෙළෙඳ පොළ
3. නාරන්දනෙයි මාළු වෙළෙඳ පොළ
4. පුලියංකුඩල් එළවළු වෙළෙඳ පොළ
5. පුලියංකුඩල් මාළු වෙළෙඳ පොළ
6. තම්බාට්ටි වෙළඳ සැළ
7. අනලතීවු මාළු වෙළෙඳ පොළ

ම.ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/16

---

**කයිට්ස් ප්‍රාදේශීය සභාව**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත - (272 අධිකාරය)

කයිට්ස් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තබාගෙන සිටින බල්ලන් වෙනුවෙන්, සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරය) 4වැනි වගන්තිය ප්‍රකාරව සෑම බල්ලෙකු වෙනුවෙන්, බල්ලෙක් හෝ බැල්ලියක් හෝ වේවා, රු. 25ක් බැගින් වූ ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් වර්ෂ 2019 සිට පනවා අය කිරීමට 2018 නොවැම්බර් මස 15 වැනි දින අංක 24 දරන තීරණය මගින් තීරණය කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ම.ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/17

## කයිට්ස් ප්‍රාදේශීය සභාව

### වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1), (2) (3) වගන්ති ප්‍රකාරව කයිට්ස් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි, පහත දැක්වෙන ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයන්හි වූ ගම්මාන, මෙම වර්ෂයේ එකී ප්‍රදේශ අත්කරගෙන තිබෙන දියුණුව හඳුනාගෙන 2019 වර්ෂයේ සිට දේපළ වරිපනම් බද්දක් පනවා අයකිරීමට 2018 නොවැම්බර් මස 15 වැනි දින අංක 25 දරන තීරණය මගින් තීරණය කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| අනලතීව් උතුර | J/37 | කරම්පොන් බටහිර | J/54 |
| අනලතීව් දකුණ | J/38 | නාරන්දනෙයි උතුර | J/55 |
| එලුවයිතීව් | J/39 | නාරන්දනෙයි වයඹ | J/56 |
| කයිට්ස් | J/49 | නාරන්දනෙයි | J/57 |
| පරුත්තියඩයිප්පු | J/50 | | |
| කරම්පොන් | J/51 | නාරන්දනෙයි දකුණ | J/58 |
| කරම්පොන් නැගෙනහිර | J/52 | සුරුවිල් | J/59 |
| කරම්පොන් නිරිත | J/53 | පුලියංකුඩල් | J/60 |

ම.ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/18

---

## කයිට්ස් ප්‍රාදේශීය සභාව

### අප ද්‍රව්‍ය බැහැර කිරීමේ පනතේ (126 වැනි අධිකාරය) යටතේ වූ දැන්වීමයි)

1987, අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අංක 520/7 දරන 1988.08.23 දිනැති අතුරු ව්‍යවස්ථාවේ 9 වැනි වගන්තිය පිළිගෙන අපද්‍රව්‍ය බැහැර කිරීමේ සේවාව සපයනු ලබන දරිද්‍රතාවය හේතුකොටගෙන ප්‍රාදේශීය සභාව මගින් නිදහස් කර ඇති පදිංචිකරුවෙකු හැර කුමන හෝ ඉඩමක පදිංචිකරුවකු ප්‍රාදේශීය සභාව විසින් නිර්දේශ කරනු ලබන එවැනි කසල සෝධක බද්දක් ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුයි යන්නට අනුකූලව කසල බැහැර කෙරෙන එක් ස්ථානයක් සඳහා පහත දැක්වෙන පරිදි ගාස්තු අය කරනු ලබන බව 2018 නොවැම්බර් මස 15 වැනි දිනැති අංක 26 දරන තීරණය මගින් තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

#### උපලේඛනය

| | *සතියට එක් දිනක්* | *අමතර සෑම වාරයකටම* |
|---|---|---|
| පදිංචි සඳහා ස්ථානයක් (ජනාවාසයක්) | රු. 50.00 | රු. 50.00 |
| අනෙකුත් පරිහරණයන් සඳහාවූ ස්ථානයක් (රාජ්‍ය, පෞද්ගලික ආයතන) | මාසිකව රු 300(සතියකට උපරිම වශයෙන් දෙවතාවක්) | |

| | | |
|---|---|---|
| විශේෂ ඉල්ලීම් මත අත් ට්‍රැක්ටරයේ ට්‍රේලරය මගින් කසළ බැහැර කිරීම සඳහා එක් වාරයකට ːඑක ලෝඩ්) | රු. 1,000.00 | අත් ට්‍රැක්ටරයේ කුලිය පැයකට රු. 500.00 |

ම.ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/19

---

**කයිට්ස් ප්‍රාදේශීය සභාව**

මහජන ක්‍රීඩා පිටියක් පරිහරණය සඳහා වූ ගාස්තු අයකිරීම

1987 ප්‍රාදේශීය සභා පනත යටතේ මා හට පැවරී ඇති බලතල අනුව 2016.02.02 දිනැති අංක 1952/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* උතුරු පළාත්, පළාත් පාලන කටයුතු භාර අමාත්‍යතුමා විසින් ප්‍රසිද්ධ කරන ලද, 2017.07.07 දිනැති අංක 2027දරන *ගැසට් පත්‍රය* මගින් මා විසින් පිළිගන්නා ලද මහජන ක්‍රීඩා පිටි පිළිබඳ නිවේදනය අදාළව කයිට්ස් ප්‍රාදේශීය සභාවේ මහජන ක්‍රීඩා පිටි වෙනුවෙන් වූ ගාස්තු වශයෙන් දිනකට (පැය අටක් පිණිස) රු. 1000 ක් ද අතිරේක සෑම පැයක් සඳහා රු. 100 බැගින් 2019.01.01 දින සිට පනවා අයකරනු ලබන 2018 නොවැම්බර් මස 15 වැනි දිනැති අංක 27 දරන තීරණය අනුව තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ම.ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

---

01-349/20

**කයිට්ස් ප්‍රාදේශීය සභාව**

වෙනත් සේවාවන් සඳහා ගාස්තු

2019.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනෙක් සේවාවන් සඳහා පහත සඳහන් ගාස්තු පනවා අයකරගන්නා බව 15.11.2018 වැනි දින හා අංක 28 දරණ තිරණය අනුව තීරණය කරන ලද බව මෙයින් දන්වනු ලැබේ.

| *විස්තර* | *ගාස්තු* *රු. ශ* |
|---|---|
| කයිට්ස් ප්‍රාදේශීය සභාවේ එළිමහන් රඟ හළ දිනකට කුලියට ලබා දීම සඳහා ගාස්තුව (24 පැය විසිහතරක්) | 1,000.00 |
| එළවළු වෙළෙඳ පොළේ වෙන්කරන ලද ස්ථානයක් සඳහා දිනකට කුලිය (4X9 අඩි) | 70.00 |
| මාළු වෙළෙඳ පොළේ වෙන්කරන ලද ස්ථානයක් සඳහා දිනකට කුලිය බිම් කුලිය (6X2 අඩි) | 60.00 |
| අනුමත ව්‍යාපාරයක් පිණිස වෙළෙඳ පොළ පරිශ්‍රයේ වෙන් කෙරෙන ස්ථානයක් සඳහා දිනකට කුලිය - බිම් කුලිය (10X10 අඩි) | 100.00 |

ම.ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව'

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/21

## කයිට්ස් ප්‍රාදේශීය සභාව

### ජල සැපයුම් සඳහා ජල නල ඇතිරීම සඳහා මාර්ගය පළුදු කිරීමට ගාස්තු අය කිරීම

මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට බලපැවෙත්වෙන පරිදි, ජල නල ඇතිරීම පිණිස මාර්ගය පළුදු කිරීමේදී, පහත දැක්වෙන පරිදි ගාස්තු පනවා අයකර ගනිමින් ප්‍රාදේශීය සභාවේ අනුමැතිය පිරිනමනු ලබන බව 2018 නොවැම්බර් මස 15 දිනැති අංක 29 දරන සභා සම්මුතියේ තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| *විස්තරය* | *ගාස්තුව රු. ශත* |
|---|---|
| (01) මාර්ගයේ පදික වේදිකාව අග පළුදු කිරීම | 150.00 |
| (02) මාර්ගයේ ගැට්ට එහායින් සමාන්තරව පළුදු කිරීම- මීටරයක දුර | 25.00 |
| (03) මාර්ගයේ ගැට්ට එහායින් සමාන්තරව පළුදු කිරීම- මීටරයක දුර | 50.00 |
| (04) අවුරුදු තුනක් ඇතුළත අළුතෙන් ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ගයක පළුදු කිරීම හරහට | 6500.00 |
| (05) අවුරුදු තුනකට පෙර ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ගයක හරහට පළුදු කිරීම | 3000.00 |

ම. ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/22

---

## කයිට්ස් ප්‍රාදේශීය සභාව

### නිකුත් කරනු ලබන සහතික, ආකෘති පත්‍ර ගාස්තු පැනවීම

2019.01.01 දින සිට බලාත්මක වන අයුරින්, නිකුත් කරනු ලබන සහතික, ආකෘති පත්‍ර වෙනුවෙන් පහත දැක්වෙන පරිදි බදු පනවා අයකරනු ලබන බව 2018 නොවැම්බර් මස 15 වැනි දිනැති අංක 30 දරන තීරණය අනුව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**උපලේඛනය**

| *විස්තරය* | *ගාස්තුව රු. ශත* |
|---|---|
| (01) ඉඩම් පැවරුම් ආකෘති පත්‍ර ගාස්තු (එකක්) | 400.00 |
| (02) ඉඩම් පැවරුම් ආකෘති පත්‍ර සලකා බැලීමේ ගාස්තු | 400.00 |
| (03) ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ගාස්තු | 400.00 |
| (04) අනුකූලතා සහතික නිකුත් කිරීම | 300.00 |
| (05) දේපළ හිමිකම් සහතික ගාස්තු | 300.00 |
| (06) නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීමේ ගාස්තු | 300.00 |
| (07) වීථි රේඛා සහතික නිකුත් කිරීමේ ගාස්තු | 300.00 |
| (08) පුස්තකාල සාමාජික ඉල්ලුම්පත්‍ර ගාස්තු | 30.00 |
| (09) පුස්තකාල සාමාජික අලුත් කිරීමේ ගාස්තු | 50.00 |
| (10) චිත්‍රපට, දර්ශන ගාස්තු | 200.00 |
| (11) සැලසුම්කරුවෙකු වශයෙන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 1500.00 |

| *විස්තරය* | *ගාස්තුව රු. ශත* |
|---|---|
| (12) සැලසුම්කරුවෙකු වශයෙන් ලියාපදිංචි අලුත් කිරීමේ ගාස්තු | 1000.00 |
| (13) ලයලත් මිනින්රදෝරුවකු වශයෙන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 1500.00 |
| (14) බලයලත් මිනින්දෝරුවකු වශයෙන් ලියාපදිංචි අලුත් කිරීමේ ගාස්තු | 750.00 |
| (15) පරිසර බලපත්‍ර ගාස්තු ඉල්ලුම්පත්‍ර | 300.00 |
| (16) වී ගෝනියක් බැහැර කිරීමේ ගාස්තු | 10.00 |
| (17) දර, පිදුරු, පොල් අතු අත් ට්‍රැක්ටරයක ප්‍රවාහනය කිරීම | 100.00 |
| (18) ගොඩනැගිලි අනුමත සැලසුමක අමතර පිටපත් නිකුත් කිරීමේ ගාස්තු | 150.00 |
| (19) වාහන කුලියට දීමේ අයදුම් පත්‍ර ගාස්තු | 20.00 |
| (20) පාපැදි බලපත්‍ර අයදුම් පත්‍ර ගාස්තු | 15.68 |
| (21) සත්ත්ව බදු අයදුම් පත්‍ර ගාස්තු | 17.51 |
| (22) ඉඩම් අනුබෙදීමේ අයදුම් පත්‍ර ගාස්තු | 250.00 |
| (23) ව්‍යාපාර බලපත්‍ර අයදුම් පත්‍ර ගාස්තු | 100.00 |

ම. ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/23

---

**කයිට්ස් ප්‍රාදේශීය සභාව**

1987, අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 153(1)යටතේ සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1) වගන්තිය ප්‍රකාරව කයිට්ස් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක හෝ, ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර පිහිටි අනුපාතය ප්‍රාදේශීය සභාව විසින් නිර්දේශ කරන ලද අනුපාතයට වඩා අඩුවන්නේ නම්, ඒ ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දෙකක (2.0) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී බද්ද ඉඩම් හිමිකරුගෙන් 2019.01.01 දින සිට අයකරගැනීමටත් 2018 නොවැම්බර් මස 15 වැනි දිනැති අංක 31 දරන තීරණය අනුව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ම. ජෙයකාන්දන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
කයිට්ස් ප්‍රදේශීය සභාව.

01-349/24

## කොළඹ මහා නගර සභාව

1979 අංක 42 සහ 1985 අංක 20 දරන මහා නගර සභා සංශෝධන පනත්වලින් සංශෝධිත මහා නගර සභා ආඥා පනතේ (252 වැනි අධිකාරය) 247 අ, 247 ආ, 247 ඇ සහ 247 ඉ යන වගන්ති යටතේ කොළඹ මහා නගර සභාව විසින් 2019 වර්ෂය සඳහා පනවා ඇති බලපත්‍ර ගාස්තු සහ බදු අය කිරීම.

2019 දෙසැම්බර් 31 වන දින පවත්වන ලද කොළඹ මහා නගර සභාවේ අංක 543 දරන සභා තීරණය ප්‍රකාරව 2019 වර්ෂයට සහ ඉන් පසුව කෙරෙන සංශෝධනයන් අදාළ පරිදි මහජනයාගේ දැන ගැනීම සඳහා ගැසට් නිවේදන මගින් ප්‍රසිද්ධ කෙරෙන තුරු කොළඹ මහා නගර සභාව විසින් පනවා අය කිරීමට ඇති වෙළෙඳ බලපත්‍ර ගාස්තු කර්මාන්ත විෂයෙහි සහ/හෝ වෙළෙඳ ව්‍යාපාර විෂයෙහි බදු සහ ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු අය කිරීම පිළිබඳව ගාස්තු චක්‍රයක් පහත දැක්වෙන උපලේඛනයෙහි (1), (2), (3), (4) අනුපිළිවෙලින් සියලු දෙනාගේම දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා ගෙවිය යුතු මෙම බලපත්‍ර ගාස්තු සහ බදු මුදල් 2019 මාර්තු මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවිය යුතු බව මෙයින් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. ටී. එම්. ඉක්බාල්,
නියෝජ්‍ය නගරාධිපති,
කොළඹ මහා නගර සභාව.

2019 ජනවාරි මස 04 වැනි දින,
කොළඹ මහා නගර සභාව,
පුරහල,
කොළඹ 07.

### උපලේඛන අංක 01

247 "අ" වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තුව

(අ) බලපත්‍ර ගාස්තු චක්‍රය :

| ස්ථානයේ වාර්ෂික වටිනාකම | | බලපත්‍ර ගාස්තුව |
|---|---|---|
| *රු. ශත.* | *රු. ශත.* | *රු. ශත.* |
| 1.00 | 20,000.00 | 1,000.00 |
| 20,001.00 | 30,000.00 | 2,000.00 |
| 30,001.00 | 40,000.00 | 3,000.00 |
| 40,001.00 | 50,000.00 | 4,000.00 |
| 50,001 සිට ඉහළට | | 5,000.00 |

(ආ) ස්ථානය භාවිතා කරනු ලබන බලපත්‍රය ලබාගත යුතු කාර්යයන් සම්බන්ධ ලැයිස්තුව :

1. මිනිරන් සකස් කිරීම හා ශ්‍රේණි කිරීම.
2. මිනිරන් ගබඩා කිරීම.
3. පොහොර නිෂ්පාදනය
4. පොහොර ගබඩා කිරීම
5. හම් ගබඩා කිරීම/නිෂ්පාදනය කිරීම.
6. කිලෝග්‍රෑම් 250 ට වඩා උම්බලකඩ ගබඩා කිරීම.
7. කුකුළන් ඇති කිරීම.
8. කළුගල් හෝ කබොක් ගල් හැරීම.
9. බොරළු හැරීම.
10. හරකුන් හෝ අශ්වයන් සඳහා මඩුවක් හෝ ඉස්තාලයක් පැවැත්වීම.
11. සත්ත්ව රෝහලක් පැවැත්වීම.
12. රබර් සකස් කිරීම.
13. මයිකා ශුද්ධ කිරීම.
14. බැටළුවන් සහ/ හෝ එළුවන් 10 ක් හෝ වැඩි ගණනක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම.

15. උළු, කොන්ක්‍රීට්, පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
16. කරදමුංගු/කෙඳි/කුරුඳු/ගෙන්දගම් දුම යොද සකස් කිරීම.
17. සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1,250 ට වඩා ගබඩා කිරීම.
18. ඔට්ටපාලු ඇඹරීම හා වේලීම.
19. ට්‍රන්ක පෙට්ටි හෝ/සහ සූට්කේස් නිෂ්පාදනය කිරීම.
20. ඉන්ජෙක්ටර් පොම්ප සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
21. විෂබීජනාශක නිෂ්පාදනය කිරීම.
22. ටයර් නැවත පිරවීමේ හෝ කට්ටා කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
23. කුරුඳු කිලෝ ග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම.
24. කොකෝවා කිලෝ ග්‍රෑම් 500 ට වඩා ගබඩා කිරීම.
25. ලී බඩු නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
26. මැණික් කැපීම සහ/හෝ දියමන්ති ඔප දැමීම. (මැණික් ව්‍යාපාරිකයන් විසින්)
27. බලයලත් වෙළෙඳුන් විසින් රබර් ගබඩා කිරීම.
28. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කිරීම.
29. වේවැල් භාණ්ඩ නිෂ්පාදනය සහ/හෝ ගබඩා කිරීම.
30. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන රෙදි මෝලක් පවත්වාගෙන යාම.
31. පිටි හෝ කුළුබඩු වර්ග ඇඹරීම.
32. වාණිජමය කටයුතු සඳහා සත්ත්ව ආහාර පිණිස කිලෝග්‍රෑම් 100 කට වඩා ධාන්‍ය ගබඩා කිරීම (සමූපකාර ගබඩාවන් හැර)
33. රබර් භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
34. මෝර වරල් සකස් කිරීම හා ගබඩා කිරීම.
35. යන්ත්‍ර මගින් ඇටකටු ඇඹරීම.
36. පොලිතින්, සැලෝලයිට් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
37. ලීටර් 25 ට වඩා සහ/හෝ කිලෝ ග්‍රෑම් 20 ට වඩා අම්ල වර්ග (ඇසිඩ්) සහ/හෝ රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම.
38. පාවහන්/පාවහන් කොටස් සහ/හෝ බූට්ස් නිෂ්පාදනය කිරීම.
39. ඉටිපන්දම් නිෂ්පාදනය කිරීම.
40. වාෂ්ප බලයෙන්, ජල බලයෙන්, විදුලි බලයෙන් හෝ යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම.
41. සිසිල් බීම/ පළතුරු බීම/ සෝස් වර්ග නිෂ්පාදනය කිරීම.
42. කොප්පරා ගබඩාවක් තබා ගැනීම.
43. යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය කිරීම.
44. යන්ත්‍රානුසාරයෙන් තලතෙල් නිෂ්පාදනය කිරීම.
45. තෙල් සිඳීම පිණිස සෙක්කුවක් හෝ අතින් ක්‍රියා කරවන මෝලක් පැවැත්වීම.
46. රෙදි වර්ග නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම.
47. ගිනිපෙට්ටි නිෂ්පාදනය කිරීම.
48. පුළුන් ගබඩා කිරීම.
49. ලීටර් 225 කට වඩා පොල්තෙල් ගබඩා කිරීම.
50. මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩා කිරීම.
51. ඇසිටිලින් සහ/හෝ ඔක්සිජන් නිෂ්පාදනය කිරීම.
52. උළු 500 ට වඩා ගබඩා කිරීම පිණිස ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම.
53. ගඩොල් 250 ට වඩා ගබඩා කිරීම පිණිස ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම.
54. කබොක් ගල් 250 ට වඩා ගබඩා කිරීම පිණිස ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම.
55. සිගරැට් නිෂ්පාදනය කිරීම.
56. බීඩි සහ/හෝ සුරුට්ටු නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
57. කිලෝග්‍රෑම් 250 ට වඩා ලී පෙට්ටි ගබඩා කිරීම.
58. කොහු නිෂ්පාදනය.
59. රස කැවිලි නිෂ්පාදනය.
60. අඟුරු සහ/හෝ පොල්කටු අඟුරු කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම.
61. බෝට්ටු හෝ බත්තල් නිෂ්පාදනය කිරීම.
62. ලී පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
63. මෝටර් රථවාහන අළුත්වැඩියා කිරීම කරන ගරාජයක් හැර යකඩ සහ/හෝ වානේ වැඩපොලක් පවත්වාගෙන යාම.
64. මෝටර් රථවාහන අළුත්වැඩියා කිරීම/ කරන ගරාජයක් හැර ඔක්සිජන් වැල්ඩිං සහ විදුලි වැල්ඩිං පොලක් පවත්වාගෙන යාම.
65. මෝටර් රථවාහන අළුත්වැඩියා කරන ගරාජයක් පවත්වාගෙන යාම.
66. මෝටර් රථවාහන සර්විස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
67. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම. (සේවකයින් 25 හෝ ඊට වැඩි)

68. පොල්තෙල් හැර වෙනත් ඕනෑම වර්ගයක තෙල් ලීටර් 50 ට වඩා ගබඩා කිරීම.
69. ගෙන්දගම් සහ/හෝ ගෙන්දගම් කුඩු කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම.
70. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය කිරීම.
71. පතරොම් 100 ට වඩා ගබඩා කිරීම.
72. කොහු/මෙට්ට/කොට්ට/කුෂන් වැනි දෑ නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම.
73. අලුත් ටයර් හෝ ටියුබ් 50 කට වඩා ගබඩා කිරීම.
74. විසිරි පින්තාරු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
75. විදුලි බලයෙන් හැර යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
76. යන්ත්‍රානුසාරයෙන් ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
77. කමිස කරපටි සහ කමිස අත් සකස් කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
78. ගරාජයක් හැර යන්ත්‍රානුසාරයෙන් විද්‍යුත් ලෝහාලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
79. ගෑස්/ගල් අඟුරු ගෑස් නිපදවීම, ගබඩා කිරීම හෝ වෙළෙඳාම් කිරීම.
80. අම්ලකර වායු බල කම්හලක් පවත්වාගෙන යාම.
81. යපස් උණු කිරීම.
82. රතිඤ්ඤා ගබඩා කිරීම.
83. කිලෝග්‍රෑම් දෙකකට වඩා වෙඩි බෙහෙත් ගබඩා කිරීම.
84. මේද, ඉටි වර්ග, මැලියම් වර්ග ගබඩා කිරීම.
85. ගෙබිම් පොලිෂ් නිෂ්පාදනය කිරීම.
86. තාර පිරිපහදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
87. ශීතකරණ සහ වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම, නැවත සකස් කිරීම, සහ පරීක්ෂා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
88. මෝටර් කාර් රථ එකලස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
89. මෝටර් බයිසිකල් හෝ ස්කූටර් හෝ ත්‍රීරෝද රථ එකලස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
90. අතුනුබහන් හා සත්ත්ව තෙල් උණු කිරීම.
91. සබන් නිෂ්පාදනය කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
92. තෙල් උණු කිරීමේ ස්ථානයක් පවත්වගෙන යාම.
93. රෙදි ඩයි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
94. සම් පදම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
95. දේශීය බෙහෙත් ද්‍රව්‍ය යොදා බීම වර්ග නිෂ්පාදනය කිරීම හා විකිණීම.
96. සව් නිෂ්පාදනය කිරීම.
97. වෙඩි බෙහෙත් නිෂ්පාදනය කිරීම.
98. ගිණිකෙළි නිෂ්පාදනය කිරීම.
99. පිදුරු ගබඩාවක් පවත්වාගෙන යාම.
100. ඇටකටු ගබඩාවක් පවත්වාගෙන යාම.
101. ගිනි ගන්නා සුළු තෙල් ගබඩා කිරීම පිණිස ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම.
102. පපඩම් නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම.
103. හෝටලයක් පවත්වාගෙන යාම.
104. ආගන්තුක නිවාසයක් පවත්වාගෙන යාම.
105. කිරි පට්ටියක් පවත්වාගෙන යාම.
106. ධාන්‍ය වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
107. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීම.
108. පුන්නක්කු කිලෝග්‍රෑම් 1000 ට වඩා ගබඩා කිරීම.
109. පුන්නක්කු හැර වෙනත් සත්ත්ව ආහාර කිලෝගෑම් 1000 ට වඩා ගබඩා කිරීම.
110. අතින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
111. පොහොර, මිනිරන්, අළුහුණු බහාලීම සඳහා පාවිච්චි කරන ලද ගෝනි ගබඩා කිරීම, ශුද්ධ කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
112. පුවක් ශුද්ධ කර දීම.
113. පොල්කටු අඟුරු කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම හෝ ඒ හා ආශ්‍රිත කර්මාන්තයක් පවත්වාගෙන යාම.
114. පරණ යකඩ ගබඩා කිරීම.
115. ග්ලූ හා ගම් වර්ග නිෂ්පාදනය සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
116. බැටරි නැවත පිරවීමේ හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
117. හිස් බෝතල් 100 ට වඩා ගබඩා කිරීම.
118. මිනී පෙට්ටි නිෂ්පාදනය සහ/හෝ ගබඩා කිරීම.

119. කපුරු නිෂ්පාදනය කිරීම.
120. පොහොර, හුණු, මිනිරන් බහාලීම සඳහා පාවිච්චි නොකරන ලද ගෝනි 100 ට වඩා ගබඩා කිරීම.
121. පාවිච්චි කරන ලද ටයර් හෝ ටියුබ් 100 ට වඩා ගබඩා කිරීම.
122. පාවිච්චි කරන ලද ඇඳුම් ගබඩා කිරීම.
123. අලුත් සහ/හෝ පරණ කඩදාසි කිලෝග්‍රෑම් 250 ට වඩා ගබඩා කිරීම.
124. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරනු නොලබන විද්‍යුත් අලේපනය, ක්‍රෝමියම් ආලේපනය, රන් ආලේපනය, රිදී ආලේපනය හෝ තඹ ආලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
125. දර මඩුවක් පවත්වාගෙන යාම.
126. හකුරු නිෂ්පාදනය සහ/හෝ ගබඩා කිරීම.
127. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම. (සේවක සංඛ්‍යාව 25 ට අඩු)
128. බොම්බයි එළු කිලෝග්‍රෑම් 250 ට වඩා ගබඩා කිරීම.
129. අර්තාපල් කිලෝග්‍රෑම් 250 ට වඩා ගබඩා කිරීම.
130. කරවල කිලෝග්‍රෑම් 500 ට වඩා ගබඩා කිරීම.
131. ජාඩි කිලෝග්‍රෑම් 500 ට වඩා ගබඩා කිරීම.
132. ඇඳුම් ඩ්‍රයි ක්ලීන් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
133. කෝපි හෝ තේ පැන් ශාලාවක් පවත්වාගෙන යාම.
134. කෑම විකුණන ස්ථානයක් හා/හෝ බත් කඩයක් පවත්වාගෙන යාම. (හුදෙක්ම සාමාජිකයින් සඳහා පමණක්ම සුභ සාධක සංගම් මඟින් පවත්වන ආපන ශාලා බලපත්‍ර ගාස්තුවෙන් නිදහස් ය.)
135. නේවාසිකාගාරයක් පවත්වාගෙන යාම.
136. භෝජනාගාරයක් හා/හෝ ආපන ශාලාවක් පවත්වාගෙන යාම.
137. බේකරියක් පවත්වාගෙන යාම.
138. බාබර් සාප්පුවක් සහ/හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම. (සම්භාහන මධ්‍යස්ථාන හැර)
139. ලොන්ඩරියක් පවත්වාගෙන යාම.
140. හුණු ගබඩා කිරීම.
141. ටයර්, ටියුබ්, වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකිය හැර)
142. බන්දිත ගුදම් පවත්වාගෙන යාම.
143. සීනි ගබඩා කිරීම සහ/හෝ වෙළඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
144. තිරිඟු පිටි ගබඩා කිරීම සහ/ හෝ වෙළඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
145. ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
146. යන්ත්‍රානුසාරයෙන්, විදුලි බලයෙන් හෝ වාෂ්ප බලයෙන් ක්‍රියා කරන කුමන අන්දමක හෝ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම සඳහා කාර්මික ආයතනයක් පවත්වාගෙන යාම.
147. මනුෂ්‍ය පරිභෝජනය සඳහා ගන්නා සියලුම ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හා ගබඩා කිරීම.
148. දේශීය හෝ බටහිර ඖෂධ නිෂ්පාදනය කිරීම.

(ඇ) (1) ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ එම මණ්ඩලය මගින් අනුමත කර ඇත්තා වූ හෝ හෝටල්වලින්, නවාතැන්පලවල්වලින් හෝ භෝජනශාලාවලින් අදාල හෝටලයේ, නවාතැන්පොලේ හෝ භෝජනාගාරයේ පසුගිය වර්ෂයේ මුළු ලැබීම් වලින් සියයට දශම පහක (0.5%) බලපත්‍ර ගාස්තුවක් 2019 ජනවාරි මස 01 වැනි දින සිට පනවා අය කිරීම.

**උපලේඛන අංක 02**

247 "(ආ)" වගන්තිය යටතෙහි ව්‍යාපාර හෝ කර්මාන්ත විෂයෙහි බදු

| ස්ථානයේ වාර්ෂික වටිනාකම | | | බලපත්‍ර ගාස්තුව |
|---|---|---|---|
| රු. ශත. | | රු. ශත. | රු. ශත. |
| 1.00 | — | 20,000.00 | 1,000.00 |
| 20,001.00 | — | 30,000.00 | 2,000.00 |
| 30,001.00 | — | 40,000.00 | 3,000.00 |
| 40,001.00 | — | 50,000.00 | 4,000.00 |
| 50,001 සිට ඉහළට | | | 5,000.00 |

(ආ) කර්මාන්ත ලැයිස්තුව :

1. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
2. කාර්යාල බඩු බාහිරාදිය ගබඩා කිරීම සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වගෙන යාම.
3. පාවිච්චි කළ සහ/හෝ අලුත් මෝටර් රථ ගෙන්වීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
4. අලුත් හෝ පාවිච්චි කරන ලද මෝටර් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
5. ශීතකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
6. වීදුරු භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
7. රූපවාහිනි යන්ත්‍ර ගෙන්වීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
8. බටහිර ඖෂධ වර්ග වෙළෙඳාම් කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
9. බලයලත් මත්පැන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
10. බිස්කට්/හෝ ටින් කෑම වර්ග විකුණනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම.
11. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
12. රෙදිපිළි වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙනයාම.
13. භාණ්ඩ ප්‍රදර්ශනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
14. බයිසිකල් විකිණීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
15. මෝටර් සයිකල් සහ/හෝ ස්කූටර් හා/හෝ ත්‍රිරෝද රථ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
16. චිනච්චට්ටි භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
17. පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
18. වායු සමීකරණ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
19. මාළු අල්ලන දැල් නිෂ්පාදනය කිරීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
20. සබන් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
21. විවිධ භාණ්ඩ නැව්ගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
22. රෙදිපිළි මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
23. මැණික් සහ/හෝ දියමන්ති කැපීමේ හා පුහුණු කිරීමේ පාසලක් පවත්වාගෙන යාම.
24. ඉවතලන නූල් හෝ ජූට් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
25. ආහාර ද්‍රව්‍ය හෝ වෙනත් පාරිභෝගික ද්‍රව්‍ය අපනයනයට සහ/හෝ ආනයනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
26. ආරක්ෂක සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
27. කැසට් පටිගත කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
28. මහන මැෂින් ගෙන්වීම සහ/හෝ විකිණීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
29. පරිගණක යන්ත්‍ර ගෙන්වීම සහ/හෝ විකිණීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
30. චංචල හෝ නිශ්චල දේපළ විකිණීමේ ස්ථානයක්/ආයතනයක් පවත්වාගෙන යාම.
31. ඇස් කණ්නාඩි නිෂ්පාදනය සහ/හෝ ස්ථානයක්/විකිණීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
32. ලාම්පු ආවරණ නිෂ්පාදනය සහ/හෝ ස්ථානයක්/විකිණීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
33. යකඩ බඩු විකිණීමේ ස්ථානයක් /ආයතනයක් පවත්වාගෙන යාම.
34. මැණික් හා දියමන්ති වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
35. තොග වශයෙන් කොහු ලණු ගබඩා කිරීමේ සහ/හෝ වෙළඳම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
36. ඉටිපන්දම් ගබඩා කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
37. ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීමේ සහ /හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
38. විදුලිබල උත්පාදන යන්ත්‍ර කුලියට දීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
39. අලුත් ටයර්, ටියුබ් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
40. ප්‍රචාරක සේවා ස්ථානයක් පවත්වාගෙන යාම.
41. සිගරැට් හෝ බීඩි වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
42. මසා නිමකළ ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
43. වාණිජමය කාර්යයන් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
44. ඔරලෝසු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
45. බීජ වර්ග සහ/ හෝ පැළ වර්ග වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
46. ගුවන් සේවා කාර්යාලයක් පවත්වාගෙන යාම.
47. සංචාරක සේවා ආයතනයක් පවත්වාගෙන යාම.
48. විදේශ රැකියා සැපයීමේ ඒජන්සියක් පවත්වාගෙන යාම.
49. කන්ටේනර් නිෂ්පාදනය කිරීමේ සහ/හෝ විකිණීමේ හෝ ගබඩා කිරීමේ අංගනයක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම.
50. රූපවාහිනි යන්ත්‍ර හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

51. සුරතලය සඳහා ඇති කරන මසුන් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
52. විශේෂඥ වෛද්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙනයාම.
53. නියෝජිත (ඒජන්සි) තැපැල් හලක් පවත්වාගෙන යාම.
54. අභ්‍යන්තර පණිවුඩ හුවමාරු කිරීමේ උපකරණ වෙළෙඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
55. ආයුර්වේද ඖෂධ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
56. මුළුතැන්ගෙයි උපකරණ ගබඩා කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
57. ඡායාරූප දල සේයාපට සේදීමේ සහ මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
58. සනීපාරක්ෂක උපකරණ සහ/හෝ පිඟන් ගඩොල් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
59. බේකරිවලට අවශ්‍ය ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
60. ලිපිද්‍රව්‍ය වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
61. ජල පොම්ප හා උපාංග වෙළෙඳාම් කිරීම.
62. අකුරු කෙටීමේ ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම.
63. සිසිල් බීම වෙළෙඳාම් කිරීම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
64. විකිණීම සඳහා වෙළඳ ද්‍රව්‍ය ගබඩා කිරීම සහ/හෝ අංගනයක් පවත්වාගෙන යාම.
65. යකඩ තහඩු හා ඇලුමිනියම් තහඩු ආශ්‍රිත වැඩපලක් පවත්වාගෙන යාම.
66. බුමුතුරුණු සහ ෆෝම්කා ෂීට්ස් විකිණීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
67. ධීවර ආම්පන්න වෙළඳාම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
68. කේක් සෑදීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යයන් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
69. කළුගල් ආශ්‍රිතව සමරු ඵලක සහ/හෝ ෆ්ලෝ ටයිල්ස් නිෂ්පාදනය කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
70. ගුවන් විදුලි යන්ත්‍ර අමතර කොටස් වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
71. පිඟන් බඩු වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
72. තෑගි භාණ්ඩ වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
73. ආහාර ද්‍රව්‍ය සහ කුළුබඩු වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
74. වාණිජමය කටයුතු සඳහා ආයතනයක් හෝ කාර්යාලයක් පවත්වාගෙන යාම.
75. දුම්කොළ ගබඩා කිරීම සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
76. දේශීය සහ/හෝ විදේශීය ආනයනික හෝ අපනයනික භාණ්ඩ ගබඩා කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
77. විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
78. කිරිගරුඬ සහ/හෝ කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
79. කඩදාසි බෑග් නිෂ්පාදනය කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
80. කෞතුක භාණ්ඩ වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
81. සිල්ලර වෙළඳසලක් පවත්වාගෙන යාම (ග්‍රොසරි).
82. සාප්පු බඩු වෙළඳසැලක් පවත්වාගෙන යාම.
83. ඡායා පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
84. අත් යන්ත්‍ර මගින් නිෂ්පාදිත රෙදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
85. පොත් පත් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
86. අරුමෝසම් බඩු වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් සහ/හෝ සැරසිලි භාණ්ඩ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
87. වීඩියෝ කැසට් පට වෙළෙඳාම් කිරීම සහ/හෝ කුළියට දීම.
88. පොත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
89. තරාදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
90. සංගීත භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
91. හිස් බැරල් ගබඩා කිරීම සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
92. මංගල හෝ අවමංගල කටයුතු සඳහා අවශ්‍ය භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ සහ/හෝ විකිණීම හෝ කුලියට දීම.
93. බිත්තර වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
94. සිහිවටන නිෂ්පාදනය කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
95. පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
96. සෙල්ලම් බඩු ගබඩා කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
97. මල් සාප්පුවක් පවත්වාගෙන යාම.
98. ප්‍රචාරක දැන්වීම්, අතින් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
99. ගොවි උපකරණ ආම්පන්න වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
100. දුරකථන/ටෙලෙක්ස් පණිවුඩ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
101. වෛද්‍ය උපකරණ ආනයනය කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීම.
102. පපඩම් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

103. පොල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
104. කිරි ආහාර වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
105. කඩල වර්ග වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
106. බයිසිකල් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
107. හැලි වලං සහ/හෝ කොහු භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
108. පළතුරු වර්ග වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
109. ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
110. ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
111. එළවළු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
112. කුඩ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
113. කට්ටකුමංජල් ගබඩා කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකිය හැර)
114. මල් පෝච්චි සහ/හෝ විවිධ පැල වර්ග වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
115. කැටයම් කැපීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
116. ගිනි නිවීමේ ආම්පන්න සහ හෝ ආශ්වාස ප්‍රාශ්වාස උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
117. කාර්යාල උපකරණ විකිණීමේ සහ/හෝ අලුත්වැඩියා කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
118. පරිගණක යන්ත්‍ර පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
119. ගෘහ නිර්මාණ ශිල්පය හෝ සැලසුම් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
120. රිය පැදවීම පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
121. දන්ත කාර්මික ස්ථානයක් පවත්වාගෙන යාම.
122. රක්ෂණ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
123. උපදේශක සේවා ආයතනයක් පවත්වාගෙන යාම.
124. සංචාරක බස් සේවා ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම.
125. බඩු ප්‍රවාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම.
126. දේශීය හා විදේශීය බැංකු ආයතන පවත්වාගෙන යාම.
127. රක්ෂණ සමාගම් පවත්වාගෙන යාම.
128. යන්ත්‍රෝපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
129. කුෂන් වැනි දෑ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
130. කැඩපත් සහ/හෝ ගොඩනැගිලි වීදුරු වර්ග වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
131. සම් භාණ්ඩ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
132. ප්ලාස්ටික් භාණ්ඩ ගබඩා කිරීම සහ/හෝ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
133. සුවඳ විලවුන් වර්ග වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
134. පාවිච්චි කරන ලද ටයර්, ටියුබ් සහ පුරවන ලද ටයර් ගබඩා කිරීම සහ/හෝ වෙළඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
135. රසායනාගාර උපකරණ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
136. පරිගණක මගින් මුද්‍රණ කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
137. ඇලුමිනියම් භාණ්ඩ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
138. ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
139. ඉරන ලද ලී ගබඩා කිරීම සහ/හෝ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
140. මැටි භාණ්ඩ නිෂ්පාදනය විකිණීම සහ/හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
141. පාන් වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
142. බතික් රෙදි නිෂ්පාදනය කිරීම සහ/හෝ විකිණීම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
143. රථ වාහන රෝද සමබර කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
144. කුඩ නිෂ්පාදනය කිරීම සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
145. නූල් නිෂ්පාදනය කිරීම සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
146. තේ කුඩු ගබඩා කිරීම සහ/හෝ පැකට් කිරීම සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
147. ලී බඩු වෙළඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
148. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම.
149. ප්ලාස්ටික් භාණ්ඩ සහ/හෝ ෆයිබර් ග්ලාස් භාණ්ඩ නිෂ්පාදනය සහ/හෝ විකිණීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
150. පෞද්ගලික සාත්තු නිවාසයක් හෝ රෝහලක් පවත්වාගෙන යාම.

151. ලොරි බොඩි සහ අනෙකුත් වාහන සඳහා බොඩි ගැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
152. විනාකිරි නිෂ්පාදනය සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
153. ශීත කළ පළතුරු බීම නිෂ්පාදනය කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
154. වෛද්‍ය පරීක්ෂණාගාරයක් පවත්වාගෙන යාම.
155. ගිනි අවි වෙළඳාම් කිරීමේ සහ/හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
156. වානේ හෝ යකඩ කම්බිවලින් තැනූ විවිධ උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
157. විවිධ එසෙන්ස් වර්ග නිෂ්පාදනය කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
158. ප්ලාස්ටික් වැනි දෑ උපයෝගී කරගෙන ක්‍රීඩා භාණ්ඩ/ විසිතුරු භාණ්ඩ හෝ වෙනත් විවිධ දෑ නිෂ්පාදනය කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
159. රසායනික ද්‍රව්‍ය සහ/හෝ රසායනාගාර උපකරණ නිෂ්පාදනය කිරීමේ ගබඩා කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
160. උත්සව සඳහා කෑම වර්ග සහ/හෝ සිසිල් බීම නිෂ්පාදනය කිරීම සහ සැපයීම.
161. කපාපු පොල් වෙළඳාමසහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
162. බණිජ වර්ග වෙළඳාම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
163. පූජා භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
164. වැලි සහ/හෝ කළුගල් ගබඩා කිරීමේ හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
165. දියලුණු කි.ග්‍රෑ. 1,000 ට වඩා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
166. කිරිහලක් පවත්වාගෙන යාම.
167. කාර් හුඩ් සහ ආසන සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
168. හඳුන්කූරු නිෂ්පාදනය සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
169. මී පැණි/ පොල් පැණි/ කිතුල් පැණි/ හෝ වෙනත් පැණි වර්ග සෑදීමේ/ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
170. කාර්මික ආයතනයක් පවත්වාගෙන යාම.
171. අවුල්පත් (රසකැවිලි) සහ /හෝ කෙටි කෑම වර්ග වෙළඳසලක් පවත්වාගෙන යාම.
172. රබර් සීල් සහ/හෝ බ්ලොක් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
173. ලෝහ සහ/හෝ ගැල්වනයිස් යකඩ තහඩුවලින් විවිධ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
174. නූඩ්ල්ස් සෑදීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
175. මයින හමක් සහ ඒ හා සමාන උපකරණයක් භාවිතා කිරීමේ ස්ථානයක් (කම්හලක්) පවත්වාගෙන යාම.
176. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම සහ/හෝ ප්‍රදර්ශනය කිරීම සහ/හෝ අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
177. රථ වාහන ගාලක් පවත්වාගෙන යාම.
178. පරිගණක සහ දුරකථන ආශ්‍රිත අන්තර්ජාල සේවා හා ඊ මේල් සේවා ඇතුළත් සයිබර් කැෆේ ආයතනයක් පවත්වාගෙන යාම.
179. බෝතල්ගත කරන ලද වතුර විකිණීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
180. උත්සවශාලා කුලියට දීම.
181. රථවාහන කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
182. වාහන බර කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
183. භාණ්ඩ නිෂ්කාශණය කිරීමේ කාර්යාලයක් පවත්වාගෙන යාම.
184. අයිස්ක්‍රීම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
185. කෘත්‍රිම මල් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
186. මහා නගර සභා ආඥාපනතේ 247 අ හෝ 247 ඈ වැනි වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු හෝ වෙළඳ ව්‍යාපාර විෂයයෙහි බදු නොගෙවන ඉහතින් සඳහන් නොවූ වාණිජ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
187. කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
188. පරිගණක අළුත්වැඩියා කිරීමේ හා උපාංග සහ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
189. ජංගම දුරකථන අළුත්වැඩියා කිරීමේ, විකිණීමේ හා අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
190. රබර් සීල් හා යකඩ මුද්‍රා නිෂ්පාදනය කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
191. නාවික කටයුතු සඳහා කාර්යාලයක් පවත්වාගෙන යාම.
192. විදුලි බිල් අයකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
193. අළුත් යකඩ වෙළෙඳාම/ගබඩා කිරීම.
194. බෝතල්ගත කරන ලද ලිහිසි තෙල් වෙළඳාම.
195. විදේශ මුදල් හුවමාරු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.

## උපලේඛන අංක 03

247 "(ඇ)" වගන්තිය යටතෙහි පනවා ඇති වෙළඳ ව්‍යාපාර විෂයෙහි බදු

(අ) බදු චක්‍රය

| | I වැනි තීරුව<br>වෙළඳ ව්‍යාපාරයෙන් ගත වූ වර්ෂයේ දී<br>ලත් ලැබීම් | II වැනි තීරුව<br>ගෙවිය යුතු බද්ද<br>රු. ශත |
|---|---|---|
| 01. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 02. | රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| 03. | රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| 04. | රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 360 0 |
| 05. | රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| 06. | රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

(ආ) බදු පනවන ලැබූ ව්‍යාපාර ලැයිස්තුව :

1. කොමිස් ඒජන්තවරු
2. ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවෝ
3. මුදල් ණයට දෙන්නන්
4. බ්‍රෝකර්වරු
5. වෙන්දේසිකරුවන්
6. මුදල් ආයෝජකයින්
7. රන් බඩු උකස් ගන්නන්
8. උපදේශකවරුන්

## උපලේඛන අංක 04

1985 අංක 20 දරන මහා නගර සභා (සංශෝධන) පනතින් සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරය) 247 "ඉ" වැනි වගන්තිය යටතේ ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු අය කිරීම.

කොළඹ මහා නගර සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර් කෙනෙකු විසින් හෝ ඔහුගේ සේවකයෙකු නැතහොත් අනුයෝජකයෙකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත් ඒ විකිණීමෙන් ලැබුණ මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් කෙනෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් එසේ ඒ ඉඩම විකුණාලත් මුදලින් සභාවට ගෙවිය යුතුය.

**සටහන :**

2019 වසර සඳහා ඉහත සඳහන් ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු අය කිරීමේ දී පහත දැක්වෙන පදනම මත ක්‍රියාත්මක වනු ඇත.

1. එක් පුද්ගලයෙකු විසින් එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කීපයකින් යුත් ගොඩනැගිල්ලක විවිධ හෝ ගොඩනැගිලි කිහිපයක එකම ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නේ නම් වාර්ෂික බදු ගණනය කිරීම සඳහා පමණක් එය එක් ස්ථානයක් වශයෙන් සලකා බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු අය කරනු ඇත.

2. එක් පුද්ගලයෙකු විසින් එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කීපයකින් යුත් ගොඩනැගිල්ලක විවිධ ව්‍යාපාර පවත්වාගෙන යන්නේ නම් එම ව්‍යාපාරය හෝ කර්මාන්තය සඳහා යොදා ගෙන ඇති බිම් ප්‍රමාණය අනුව වාර්ෂික වටිනාකම කොටස් කර බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු වෙන වෙනම අය කරනු ඇත.

3. එක් පුද්ගලයෙකු විසින් එකම වර්ගයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල වරිපනම් අංක කිහිපයකින් සමන්විත ගොඩනැගිල්ලක් වුවද එය එකම වරිපනම් අංකයක පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් ලෙස සලකා ව්‍යාපාර බදු හෝ බලපත්‍ර ගාස්තු අය කරනු ඇත. එසේ වුවද එම ස්ථානයේ වාර්ෂික බලපත්‍ර ගාස්තුව හෝ ව්‍යාපාරික බද්ද උපරිමය රුපියල් 5,000 ට අඩු වන්නේ නම් එවැනි අවස්ථාවක අදාළ සියලුම ගොඩනැගිලිවල වරිපනම් අංකවල වාර්ෂික වටිනාකම ඒකාබද්ධ කර ලැබෙන මුළු තක්සේරු අනුව බලපත්‍ර ගාස්තුව හෝ ව්‍යාපාරික බද්ද තීරණය කරනු ඇත.

4. එක් පුද්ගලයෙකු විසින් වරිපනම් අංක කිහිපයක, විවිධ ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථාවක එකී වරිපනම් අංක එකට යාව පිහිටියේ වුවද තම එක් එක් ව්‍යාපාරය හෝ කර්මාන්තය වෙනුවෙන් වෙන වෙනම බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු අය කරනු ඇත.

5. එක් වරිපනම් අංකයක් යටතේ පුද්ගලයින් කිහිප දෙනෙකු ව්‍යාපාර පවත්වාගෙන යන්නේ නම්, ඒ එක් එක් ව්‍යාපාරය සඳහා යොදා ගනු ලබන ස්ථානයේ බිම් ප්‍රමාණය අනුව එකී ගොඩනැගිල්ලේ වාර්ෂික තක්සේරුව කොටස් කර බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු වෙන වෙනම අය කරනු ලැබේ.

01 - 474

---

**තවලම ප්‍රාදේශීය සභාව**

**පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු ආවරණ අනුමැතිය ලබා දීමේ ගාස්තු හා තවලම ප්‍රාදේශීය සභාව සතු දේපළ සහ තවලම ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන සේවා වෙනුවෙන් 2019 වර්ෂය සඳහා ගාස්තු අය කිරීම**

**නිවාස සහ නගර සංවර්ධන ආඥාපනත**

තවලම ප්‍රාදේශීය සභා බල සීමාව තුළ සිදු කරනු ලබන සංවර්ධන කාර්යයන්ගෙන් ඉඩම් අනුබෙදීම මත අය කරනු ලබන හා මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීමේ ගාස්තු නිවාස සහ නගර සංවර්ධන ආඥා පනතේ බලතල ක්‍රියාත්මකව තවලම ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018.08.20 වැනි දින පැවති මහ සභාවේ තීරණ අංක 05 යටතේ බල ප්‍රදේශයන්ට පොදුවේ අදාළ වන පරිදි සහ තවලම ප්‍රාදේශීය සභාව සතු දේපළ සහ තවලම ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන සේවා වෙනුවෙන් 2019 වර්ෂය සඳහා පහත උපලේඛනයේ දක්වා ඇති ගාස්තු අය කළ යුතු යැයි තීරණය වූ බවට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

*ඉඩම් අනුබෙදුම් හා මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීම මත පෙරසැරි ගාස්තු අය කිරීම.*

තවලම ප්‍රාදේශීය සභා බල සීමාව තුළ සිදු කරනු ලබන සංවර්ධන කාර්යයන් අතරින් ඉඩම් අනු බෙදුම් හා මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීම සඳහා පෙරසැරි ගාස්තු නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතේ බලතල ක්‍රියාත්මකව බල ප්‍රදේශයට පොදුවේ අදාළ වන පරිදි 2018 වර්ෂයේ අගෝස්තු මස සිට පහත දක්වා ඇති ගාස්තු සභා සම්මත කර ගන්නා ලදි.

| මූලික සැලසුම් නිරාකරණය අනුමැතිය | | පෙරසැරි ගාස්තු |
|---|---|---|
| 1. ඉඩම් අනු බෙදුම් සඳහා | 1. | ව.මී. 1000ට අඩු ඉඩම් සඳහා රු. 500<br>ව.මී. 1001 - 5000 අතර රු. 2000<br>ව.මී. 5000 - 10000 දක්වා රු. 5000 |

වර්ග මීටර් 10000 සිට වැඩිවන සෑම ව.මී. 1000 කටම රු. 250 බැගින්

| | |
|---|---|
| 2. මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීම | 2. පර්චස්<br>ව.මී. 150 - 300 අතර පර්චස් 10ට අඩු රු. 200<br>ව.මී. 301 - 600 අතර පර්චස් 10 - 23 රු. 300<br>ව.මී. 601 - 900 අතර පර්චස් 24 - 40 රු. 400 |

පර්චස් 40 සිට වැඩි වන සෑම පර්චස් 01 ට හෝ ඉන් කොටසකට රු. 10 බැගින් අයකළ යුතුයි.

01 - 479

## බදුල්ල මහ නගර සභාව

බදුල්ල මහ නගර සභා 2019 වර්ෂය සඳහා
ආදාහනාගාර, ගලි රථ සේවාව, ගව කොටු සම්බන්ධ ගාස්තු අය කිරීම

252 වන අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 238 (1) උප වගන්තිය ප්‍රකාරව හා එම ආඥා පනතේ 286 "අ" වගන්තිය ප්‍රකාරව මා වෙත ලැබී ඇති බලතල අනුව 2019 වර්ෂය සඳහා වූ ඉහත සඳහන් ගාස්තු පහත සඳහන් පරිදි අනුමත කර ඇති බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

**උපලේඛනය**

| ආදාහනාගාරය සඳහා ගාස්තු | | | | සංශෝධිත උප ලේඛනය රු. ශත. |
|---|---|---|---|---|
| නගර සීමාව තුළ | | | | 8,000.00 |
| නගර සීමාව තුළ (රාත්‍රී 7.00) | | | | 8,500.00 |
| නගර සීමාවෙන් පිටත | | | | 10,000.00 |
| නගර සීමාවෙන් පිටත (රාත්‍රී 7.00) | | | | 10,500.00 |
| පූජ්‍ය පක්ෂය සඳහා (නගර සීමාව තුළ හා පිටත) | | | | 5,000.00 |
| ගලි රථ සේවාව සඳහා ගාස්තු | | | | සංශෝධිත උපලේඛනය රු. ශත. |
| | | N.B.T 2% | V.A.T 15% | |
| නගර සීමාව තුළ (ගෘහස්ථ) | 5,000.00 | 100.00 | 765.00 | 5,865.00 |
| අමතර ලෝඩ් 01 ක් සඳහා | 5,000.00 | 100.00 | 765.00 | 5,865.00 |
| නගර සීමාවෙන් පිටත (ගෘහස්ථ) | 12,000.00 | 240.00 | 1,836.00 | 14,076.00 |
| නගර සීමාව තුළ හා පිටත (රාජ්‍ය හා පොදු ආයතන) | 7,000.00 | 140.00 | 1,071.00 | 8,211.00 |
| රජයේ නිල නිවාස | 5,000.00 | 100.00 | 765.00 | 5,865.00 |
| ගවකොටු සඳහා ගාස්තු | | N.B.T 2% | V.A.T 15% | |
| ගවයෙකු සඳහා ගවකොටු ගාස්තු | 250.00 | 5.00 | 38.25 | 293.25 |
| එළුවෙකු සඳහා ගවකොටු ගාස්තු | 150.00 | 3.00 | 22.95 | 175.95 |

ගලි රථ සේවා සඳහා මහ නගර සභා බලප්‍රදේශයෙන් පිටතට යාමේදී 1km සඳහා යාමට රු. 300.00 හා ඒමට 300.00 බැගින් අයකරනු ලැබේ.

ඉහත සඳහන් ගාස්තුවලට අමතරව එදිනට ක්‍රියාත්මක රජයේ අනුමත බදු මුදල් ද මේ සමග අයකරනු ලැබේ.

ඩබ්. ඩී. ප්‍රියන්ත අමරසිරි,
නගරාධිපති,
මහ නගර සභාව,
බදුල්ල.

2018 දෙසැම්බර් මස 27 වැනි දින
බදුල්ල මහ නගර සභා කාර්යාලයේ දී ය.

01-480

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.